# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,904 — 1970 අප්‍රේල් 30 වැනි බ්‍රහස්පතින්ද — 1970.4.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 583 | කොටුපල් ටෙන්ඩර් හා වෙනත් ටෙන්ඩර් විකිණීම ... ... | 610 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 595 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 597 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 609 | විවිධ දැන්වීම ... ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම පිළිබඳ

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ආර්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු උපාධි ලත්, II වැනි ශ්‍රේණියේ කථිකාචාර්යවරුන් ඔවුන්ගේ වැටුප් ක්‍රමයේ උපරිමය වන වර්ෂයකට රු. 11,040 වැටුප් පියවරට පැමිණ එක් අවුරුද්දක් එම වැටුප් පියවරෙහි සේවය කරනු ලැබුවේ නම්, ඔවුහු රු. 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධකයන් සහිතව, අවුරුද්දකට, රු. 13,440 ක වැටුප් පියවර දක්වා වැටුප් ලැබීමට හිමිකම් ලබති.

**4. අවශ්‍ය සුදුසුකම්.—**

සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970. 5. 15 වැනිදා තමන්ගේ වයස අවුරුදු 21 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා විෂයයන් සහිතව බී.එස්.සී. ඉංජිනේරු උපාධිය ලබා තිබීම, හෝ

(ii) ඒ.එම්.අයි. යාන්ත්‍රික ඉංජිනේරු I වැනි හා II වැනි කොටස්වලින් සමත් වීම, හෝ

(iii) සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම.

(ඩී) සිංහලෙන් ඉගැන්වීමට හැකියාව තිබීම හෝ සිංහල ප්‍රවීණතාවය පත්වීමේ දින සිට අවුරුදු තුනක් ඇතුළත ලබා ගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය. (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර යෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද (' බී ' සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සමග භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද (" ඒ " සලකුන දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුනු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතු ය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 23 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය,
තැ. පෙ. 500

4–965/2—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 70/එක්ස්. 2237/69.

## මහා භාණ්ඩාගාරය

### අධ්‍යක්ෂ තනතුර (සංඛ්‍යා අංශය)

මහා භාණ්ඩාගාරයේ සංඛ්‍යා අංශයේ අධ්‍යක්ෂ තනතුර සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පහත සඳහන් දිනයෙහිදී හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවනු ලැබිය යුතුය.

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 මැයි මස 15 වැනිදා.

(ආ) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 මැයි මස 22 වැනිදා.

**සටහන :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත් ආකෘති පත්‍රයන් තැපෑලෙන් එවන ලෙස ඉල්ලා සිටින විට, අයදුම්කරු රාජ්‍ය සේවයෙහි නියුක්ත නිලධාරියෙක්ද, නැද්ද යන වග ඉතාමත්ම පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට වඩා කුඩා නොවූවද, ස්වකීය ලිපිනය ලියන ලද්දාවූද හා මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම්පත් ආකෘති පත්‍රයක් හෝ ඒ සම්බන්ධව ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලීමට නොපිළිවන. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගනු ලැබිය යුතුය.

(iii) විදේශීය අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත් ආකෘතිපත්‍රයන් විදේශීය ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබාගත හැකිය. ස්වකීය ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තම තමන් පදිංචි හෝ, තම තමන්ට ආසන්නම හෝ රටට පත් කරනු ලැබ සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාර දීමට, ස්වකීය අභිමතය අනුව අයදුම්කරුවන්ට පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයන්ගෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් සේවය සඳහා ශාරීරික වශයෙන් සුදුසුවන්නේද යන වග දැනගැනීම පිණිස, ඔවුන් පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහාවූ ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහාවූ ඔවුන්ගේ නැව් ගාස්තුවක් ඔවුන් විසින් ගෙවනු ලැබිය යුතුය.

2. (අ) ස්ථිරවූ හා විශ්‍රාම වැටුප් සහිතවූද පදනමක් පිට විවාහක දීමනාවද සමග, වර්ෂයකට රු. 20,640—3×600—2×900—24,240 ක්වූ ඒකාබද්ධ වැටුප් පරිමාණය, හෝ

(ආ) ද්විතීයතාය කෙරෙන සංඛ්‍යා නිලධාරීන්ට අමතර දීමනාවක්ද සහිතව ඔවුන්ගේ සංඛ්‍යා වැටුප් ;

(ඇ) කොන්ත්‍රාත්තු පිට බඳවා ගන්නා නිලධාරීන්ට, පළමුවෙන් අවුරුදු 3 කට නොවැඩි කාල සීමාවක් සඳහා විශ්‍රාම වැටුප් රහිත පදනමක් පිට, මාසයකට රු. 2,000—50—2,500 වැටුපක්ද වේ.

**සටහන :** තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඔහු යථෝක්ත වැටුප් පරිමාණයේ පියවරක තබනු හැකිය.

**3. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම —

(අ) ඔහු විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්තව සිටින බවටද,

(ආ) 1970.5.15 වැනි දිනට වයස අවුරුදු 35 ට අඩු හා 50 ට නොවැඩි බවටද, සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන්ට යථෝක්ත උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

(ඇ) ගණිතය/විද්‍යාව/ආර්ථික විද්‍යාව/වාණිජ්‍ය විද්‍යාව/ගණකාශාස්ත්‍රය පිළිබඳ විශ්ව විද්‍යාලීයය ගෞරව උපාධිය හා එංගලන්තයේ හෝ වේල්සයේ හෝ ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනයේ අවසාන විභාගය.

(ඈ) **පළපුරුද්ද.**—පෞද්ගලික අංශයක හෝ රාජ්‍ය අංශයේ හෝ වාණිජ හෝ කාර්මික ආයතනයක පහත සඳහන් ක්ෂේත්‍රයන් ඇතුලත්වන වගකිව යුතු තත්ත්වයක, යටත් පිරිසෙයින්, අවුරුදු පහක්වත් පළපුරුද්දක්, අධ්‍යාපන සුදුසුකම් ලැබුවායින් පසුව, ලබා තිබිය යුතුය :—

(i) මුදල් පරිපාලනය හා කළමනාකාරිත්වය.

(ii) මුදල් හා පිරිවැය විමර්ශන,

(iii) ගණන් තැබීම, පිරිවැය තැබීම හා කළමනාකාරිත්වය පිළිබඳ සවිස්තර ක්‍රම සම්පාදනය.

(iv) යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම සහ මිළ නියම කිරීම.

4. පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ සියල්ලම, ඉල්ලා සිටි විටක, ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානමින් සිටිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (අධ්‍යාපන රෙගුලාසි සංග්‍රහයේ ප්‍රකාර උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරනු ලබන උප්පැන්න සහතික හෝ හෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස් විභාග පිළිබඳ සහතික.

සටහන : (i) ඉල්ලුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

(ii) ඉල්ලා සිටි විටෙක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

5. රාජ්‍ය සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර, තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතුය. එසේ කුදු වුවත්, ස්වකීය ඉල්ලුම්පත්‍ර එසේ එවනු ලැබුවේ කවර දිනකදීද යනු ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගත හැකි වන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත් ආකෘතිය සමග තමන් වෙත එවන ලද (ආ අක්ෂරය දරණ) මුද්‍රිත තැපැල්පත මේ සඳහා පාවිච්චි කරනු ලැබිය යුතුය.

6. ඉල්ලුම්පත්‍ර හා ඒ සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියකියවිල්ලක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පෞද්ගලිකව නමට නොඑවිය යුතුය.

7. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

8. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර ආකෘතිපත්‍රය සමග තම තමන් වෙත නිකුත් කරනු ලැබ ඇති මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් පරිදි සම්පූර්ණ කොට ආපසු එවනු ලැබිය යුතුය. එවිට ඉල්ලුමපත් ආකෘතිය මෙම කාර්යාලය වෙත ලැබුන බැව් ඔවුන්ට දන්වා සිටිනු ලැබේ. මෙම නියමය පිළි නොපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ලැබුණ බැව් ඔවුන්ට දන්වනු නොලැබේ. මෙම නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයෙහිදී සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම්පත්‍රය ලැබුණ බවට දන්වීමක් නොලබන්නාවූද, අයදුම්කරුවන් විසින් ඒ බැව් වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මෙම විධානය ඉටු කිරීම පැහැර හරිනු ලැබුවහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වනු ඇත.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 23 වැනිදා,
කොළඹ,
ගාලු මුවදොර,
මහා ලේකම් කාර්යාලයේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

4–965/3—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### ගම්බද උසාවි සභාපති තනතුරු

ගම්බද උසාවි සභාපති තනතුරු දෙකක් පිරවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව අදහස් කර ඇත. යථෝක්ත තනතුරු සඳහා ලංකාවේ පුරවැසියන් වන මනා සිංහල දැනුමක් ඇති නීතිඥවරුන් ගෙන් අයදුම් පත් භාරගනු ලැබේ.

2. අයදුම්පත් ලියා එවිය යුත්තේ කොළඹ 12, තැ. පෙ. අංක 573, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ගෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රවලය. 1970 මැයි මස 30 වැනි දිනට හෝ ඊට කලින් හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස ඉල්ලුම් පත් එවිය යුතුය.

3. කලින් අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත් නැවත සලකා බලනු ලැබීමට කැමැති නම් ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් ට ලියා දන්විය යුතුය.

4. තෝරාගනු ලබන අයදුම්කරුවන්ට වැටුප් ගෙවනු ලබන්නේ රු. 180 වාර්ෂික වැඩිවීම් 7 කින් ද, රු. 240 ක වාර්ෂික වැඩිවීම් 2 කින් ද, රු. 360 වාර්ෂික වැඩිවීම් 7 කින් ද යුතු රුපියල් 7,680 ක් ලැබීමටත් රුපියල් 8,880 ක් ලැබීමටත් පෙර කාර්යක්ෂමතා කඩඉම් වලින්ද සමන්විත වූ වර්ෂයකට රු, 6,780 කින් පටන්ගෙන වර්ෂයකට රු. 11,040 තෙක් නගින ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් අනුවය.

5. ආණ්ඩුවෙන් අනුමත කරන ලද නියෝගවලට හා ගණන් ප්‍රමාණ වලට අනුකූලව ප්‍රවාහණ දීමනාවක්ද ගෙවනු ලැබේ. නිවාඩු සහ සෙසු කොන්දේසි අදාල වන්නේ රාජ්‍ය සේවාවට බැඳෙන නවකයන් සම්බන්ධයෙන් වූ රෙගුලාසි අනුවය.

6. මේ තනතුර දැරීමට සෞඛ්‍ය අතින් තමන් යෝග්‍ය බැව් ඔප්පු කිරීමට තෝරාගනු ලැබූ අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතු අතර, දිවයිනේ ඕනෑම ස්ථානයක ගම්බද උසාවි සභාපති වශයෙන් සේවය කරනු ලැබීමට ද යටත් විය යුතුය. මෙම පත්වීම ආධුනිකතා කාල පරිච්ඡේදයකට ද යටත් වන්නේ ය.

7. අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් ඒ පරීක්ෂණයට පැමිණිය යුත්තේ ස්වකීය වියදමිනි.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 අප්‍රේල් මස 20 දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායඞාලය,
තැ. පෙ. අංක 573,
කොළඹ 12.

4–971—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### සහාය වාදක තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති රජයේ සංගීත විද්‍යාලයේ සහාය වාදක තනතුරු සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහතින් පෙනෙන ආදර්ශ ආකෘතිපත්‍රය අනුව පිළියෙළ කරන ලද ඉල්ලුම්පත් 1970.5.17 දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් (පාසල් පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. මෙම තනතුරට අයත් ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය.—රු. 3,450—17×90—රු. 4,980 වේ.

3. **වයස් සීමාව.**—1970.5.17 දිනට අවුරුදු 25 ට නො අඩු විය යුතු අතර අවුරුදු 45 ට නො වැඩි විය යුතුයි. (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

4. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙකුටම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

(ii) (අ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක්.

(ආ) සිංහල භාෂාවෙන් උගැන්වීමට හා වාර්තා තැබීමට හැකියාව.

(iii) (අ) ඉන්දියාවේ පිළිගත් සංගීත ආයතනයක උතුරු ඉන්දීය සංගීතය පිළිබඳ ඩිප්ලෝමා උපාධිය හෝ වෙනත් උපාධියක් හෝ,

(ආ) ලංකා ජාතික කලායතනයේ/රජයේ සංගීත විද්‍යාලයේ උතුරු ඉන්දීය සංගීතය පිළිබඳ හය අවුරුදු සහතිකය හෝ,

(ඉ) ලංකා ගාන්ධර්ව සභාවේ/රජයේ සංගීත විභාගයේ සංගීතය පිළිබඳ අවසාන සහතිකය.

(iv) පහත සඳහන් භාණ්ඩ අතුරෙන් අඩු වශයෙන් එක් භාණ්ඩයක් වාදනය කිරීමට විශිෂ්ඨ නිපුණත්වයක් හා ඉන් තවත් එකක් හෝ වැඩි ගණනක් වාදනය කිරීමට පිළිගත හැකි සාමාන්‍ය හැකියාවක් :—

(අ) වයලින්, එස්රාජ්, සාරංගි, දිල්රුබා, බටනලා.

(ආ) තබ්ලා, පඛ්වාජ්, කෝල්, ඩෝල්, ගැටබෙර, යක්බෙර හා උඩැක්කි.

සටහන :

(i) භාණ්ඩ වැඩි ගණනක් වාදනය කිරීමට හැකියාවක් ඇති, විශේෂයෙන් ම ඉහත සඳහන් කොටස් දෙකෙහිම ඇති භාණ්ඩ වාදනය කිරීමට හැකියාවක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ii) භාණ්ඩ වැඩි සංඛ්‍යාවක් වාදනය කිරීමට හැකි අය පත් කිරීමේ අදහසින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

5. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනාත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරියෙකු තෝරා ගනු ලැබුව හොත් ඔහු අවුරුදු 1 ක කාල සීමාවක් වැඩ බැලීමේ පදනම මත පත්කරනු ඇත.

(iii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද තෝරා පත් කරනු ලැබූවන් අනුකූල විය යුතුය.

6. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවේ ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

7. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පත්වලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුළත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාරගනු නො ලැබේ.)

(ආ) ලබා ඇති උසස් ම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික.

(ඇ) අයදුම්කරුවන්ගේ චරිතය පිළිබඳ මෑතක දී ලබාගත් සහතික තුනක්. (සැ. යු.—දැනට රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් විසින් චරිත සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

8. ඉල්ලුම්පත්‍ර හා අනෙකුත් ලියවිලි මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

10. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනය පසු වී දින 14 ක් ඇතුළත පිළිතුරක් නො ලැබුණ හොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මෙම අවශ්‍යතාවය පැහැර හැරියහොත් තම අයදුම්පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට හෝ ඇයට හෝ අහිමිවනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් 22 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ඉල්ලුම් පත්‍රය

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

රජයේ සංගීත විද්‍යාලයයේ සහාය වාදක තනතුරු

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන් ලියන්න.)

2. තැපැල් ලිපිනය :————.

3. ජාතිය :————.
(ලාංකික වන්නේ, (අ) පරම්පරාවෙන් ද ? (ආ) ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියෙකු වන්නේ ලියාපදිංචි කිරීමෙන් නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් හැඳුනුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට නියම වයස :—
අවුරුදු :———, මාස :———, දින :———.
(ආ) උපන් දිනය :—අවුරුද්ද :———, මාසය :———, දිනය :———.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න.)

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

7. අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. පාසලෙන් අස් වූ දින සිට කරන ලද රැකියා සම්බන්ධ විස්තර :————.

| දෙපාර්තමේන්තුව | දැරූ තනතුර | සේවා කාලය සිට | දක්වා |
|---|---|---|---|
| ———— | ———— | ———— | |

9. සංගීතය පිළිබඳව ලබා ඇති සහතික :————.
(නිකුත් කළ ආයතනයේ නම සඳහන් කරන්න.)

10. වාදනය කිරීමේ විශේෂ නිපුණත්වය ලබා ඇත්තේ කිනම් භාණ්ඩද ? :————.

11. මා විසින් ඉහත සඳහන් කරන්නට යෙදුණ විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි අඩංගු යම්කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි බව සොයාගනු ලැබුවහොත්, තේරීමට කලින් මා නුසුදුසු වීමටත් පත් වීමෙන් පසු එම ප්‍රමාද දෝෂය අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකරනු ලැබීමටත් මා යටත් වන බව ද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–958—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### පර්යේෂණාගාරයේ සහකාර යාන්ත්‍රික මූලික තනතුර

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පර්යේෂණාගාරයේ සහකාර යාන්ත්‍රික මූලික තනතුරක් සඳහා අයදුම්පත් එවන මෙන් මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ ආකාරයට පිළියෙල කරන ලද අයදුම් පත් 1970 මැයි 22 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස "කොළඹ 7, තැ. පෙ. 1138, වාරිමාර්ග අධ්‍යක්ෂ" යන ලිපිනයට එවිය යුතුය. අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

2. සේවයට භාර ගැනීම් පිළිබඳ කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනාත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

3. වැටුප් ක්‍රමය.—වර්ෂයකට ඒකාබද්ධ රු. 5,304—144×9, 180×8—රු. 8,040 (රු. 6,780 පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමක් ඇතිව)

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක් ම තමා,

(i) ලාංකිකයෙකු බවත් (පරම්පරාවෙන් පැවත එන හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ පුරවැසියා ලාංකිකයෙකි.),

(ii) 1970 අප්‍රේල් මස 30 දින දී වයස අවුරුදු 35 ට නොවැඩි බවත් (රජයේ සේවයේ දැනටමත් නියුතු අය කෙරෙහි මෙම වයස් සීමාව බලපානු නොලැබේ.),

(iii) විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවත්,

(iv) පහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් සහ අවශ්‍ය පළපුරුද්ද ඇති බවත් සනාථ කළ යුතුය :—

(අ) (i) ගණිතය, භෞතික විද්‍යාව සහ ව්‍යවහාරික ගණිතය යන විෂයයන් ඇතුලත්ව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රය හෝ එකී විෂයයන් සහ සිංහල/දෙමළ භාෂාවද ඇතුළුව වරකදී විෂයයන් 5 කට නොඅඩුව පිට පිට දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සා. පෙ.)

සහ

(ii) පිළිගත් ඉංජිනේරුමය ආයතනයක කර්මාන්ත ශාලා ප්‍රායෝගික වැඩ පිළිබඳ පස් අවුරුදු පළ පුරුද්දක්. මෙම අවුරුදු 5 පළපුරුදු කාල සීමාවට ප්‍රථමයෙන් අවුරුදු 5 ක ආධුනිකත්ව කාලසීමාවක් ඇතුලත් විය යුතුය.

හෝ

(ආ) (i) ලංකා කාර්මික විද්‍යාලයේ යාන්ත්‍රික හෝ විදුලි ඉංජිනේරුමය ඩිප්ලෝමා සහතිකය හෝ ඒ හා සමාන වෙනත් සහතිකයක්.

හෝ

(ii) පිළිගත් ඉංජිනේරුමය ආයතනයක කර්මාන්ත ශාලා ප්‍රායෝගික වැඩ පිළිබඳ තුන් අවුරුදු පළ පුරුද්දක්. මෙම අවුරුදු 3 පළපුරුදු කාල සීමාවට ප්‍රථමයෙන් අවුරුදු 5 ක ආධුනිකත්ව කාලසීමාවක් ඇතුලත් විය යුතුය.

හෝ

(ඇ) ප්‍රධාන පුහුණු කම්කරු ශ්‍රේණියේ සහ වැඩ මූලික/කර්මාන්තශාලා මූලික ශ්‍රේණියේ 10 අවුරුදු සේවා කාලයක් සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත වැඩ මූලික/කර්මාන්තශාලා මූලිකයින් හටද මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ හැක. ඔවුන්ට තිබිය යුතු පළ පුරුද්දට ජල ශක්ති විද්‍යාමය හෝ ඒ හා සමාන වූ ආකෘතීන් වලින් කෙරෙන හැදෑරීම් සඳහා කොටස් නිර්මාණය කිරීම පිළිබඳ පළපුරුද්දක් ඇතුලත් විය යුතුය.

5. රජය යටතේ දැනට සේවය කරන අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය.

6. අයදුම්කරුවන් පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) තමන්ගේ අයදුම් පත්‍ර වලට අමුණා එවිය යුතුය. මේවා ආපසු එවනු නොලැබේ :—

(i) ලබා ඇති අධ්‍යයන සුදුසුකම් පිළිබඳ සහතික.

(ii) පිළිගත් ඉංජිනේරුමය ආයතනයක පළපුරුද්ද සහ ආධු නිකත්ව කාළ සීමාව පිළිබඳ සහතික.

(iii) මෑතදී ලබාගත් චරිත සහතික තුනක්. (මින් එකක් අයදුම් කරු අන්තිමට උගත් පාසැලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු ය.)

(iv) උප්පැන්න සහතිකය.

සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාඨශාලාවල මරගුලාසි මාලාවේ අවශ්‍යතාවයන් සඳහා නිකුත් කරනු ලබන සහතික හෝ භාරගනු නොලැබේ.)

7. තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නියම කරනු ලබන ප්‍රමාණයක හා අන්දමක ඇපයක් තැබිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍යසේවා තනතුරු වලට පත් කිරීම සම්බන්ධ යෙන් අදාල වන පොදු කොන්දේසි වලට අයදුම්කරුවන්ගේ අව ධානය යොමු කරනු ලැබේ.

පී. කාසිලිංගම්,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවටය.

1970 අප්‍රේල් මස 22 දින,
තැ. පෙ. 1138, කොළඹ 7,
වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදී ය.

## ආදර්ශ ආකෘති පත්‍රය

### වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පර්යේෂණාගාරයේ සහකාර යාන්ත්‍රික මූලික තනතුර

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
   (පැහැදිලි අකුරෙන්)
2. තැපැල් ලිපිනය :————.
3. (අ) අයදුම්කරු උපන් දිනය හා ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

   (ආ) පහත දැක්වෙන අයවළුන් උපන් ස්ථාන.

   (i) අයදුම්කරුගේ පියා :————.

   (ii) අයදුම්කරුගේ පියාගේ පියා :————.

   (iii) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

   අයදුම්කරු ලංකාවේ උපන් අයෙක් නම්, (ආ) (i) හෝ (ii) සහ (iii) හෝ පිරවිය යුතුය. අයදුම්කරු උපන්නේ ලංකාවේ නොවේ නම් එක්කෝ (ආ) (i) සහ (ii) හෝ (ii) සහ (iii) පිරවිය යුතුය.
4. ජාතිය :————.
5. විවාහකද, අවිවාහකද, වැන්දඹුද යන බව :————.
6. අධ්‍යයන සුදුසුකම්, සමත් වූ විෂයයන් ද සමඟ :————.
   (සහතික පිටපත් අමුණන්න.)
7. ඩිප්ලෝමා සහතිකයක් ලබා ඇත්නම්, එය :————.
8. පිළිගත් ඉංජිනේරු ආයතනයක පළපුරුද්ද සහ ආධුනිකත්ව කාලසීමාව පිළිබඳ විස්තර :————.
   (සහතික පිටපත් අමුණන්න.)
9. දැනට තනතුරක් දරන්නේ නම් එම තනතුර :————.
   (ස්ථිරද, තාවකාලිකද යන වග සඳහන් කරන්න.)
10. අමුණා ඇති චරිත සහතික ලබාගත් අය :————.
    (i) ————.
    (ii) ————.
    (iii) ————.

මෙම අයදුම් පතේ ම විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත්, මම මෙයින් සහතික කරමි. මෙම අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබුණ බව තෝරා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත්, මා එයින්ම නුසුදුසු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව එළිදරව් වුවහොත්, කිසිම වන්දියක් නොමැතිව මාව රාජකාරියෙන් පහකර දැමීමට හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————.

දිනය :————.

4–923—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/2/211

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1970 ප්‍රංශ රජයේ පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව

පහත සඳහන් ක්ෂෙත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ප්‍රංශ රජය විසින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :—

"අ" වර්ගය

1. විද්‍යාව.
2. ඉංජිනේරු විද්‍යාව හා

"ආ" වර්ගය

1. ප්‍රංශ භාෂාව හා සාහිත්‍යය.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් එක් වර්ෂයක් වන්නේ ය. මෙම කාලය දීර්ඝ කිරීමට ඉඩ තිබේ.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ප්‍රංශ බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම් කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) 1970.5.14 වැනි දිනට, වයස අවුරුදු 30 ට අඩු විය යුතුයි.

(iii) (අ) **අයදුම් කරන්නේ "අ" වර්ගය යටතේ පාඨමාලාවක් සඳහා නම්.**—හැදෑරීමට අදහස් කරන විෂයයට අදාල වනසේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් දෙවැනි පෙළ උපාධියක්වත් යටත් පිරිසෙයින් තිබිය යුතුයි.

(ආ) **අයදුම් කරන්නේ "ආ" වර්ගය යටතේ පාඨමාලාවක් සඳහා නම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත්, ප්‍රංශ භාෂාව විෂයයක් ලෙස ඇතුලත් උපාධියක් තිබිය යුතුයි.

(iv) ඉගෙනීම කඩනොකළ අය විය යුතුයි.

(v) ප්‍රංශ භාෂාව පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුයි.*

(* ප්‍රංශ භාෂාව පිළිබඳ හොඳ දැනුමක් තිබෙන අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලබේ. එහෙත්, මේ අවශ්‍යතාව සපුරාලන අයදුම්කරුවන් නොමැති කල්හි තෝරාගනු ලබන අපේක්ෂකයන් ප්‍රංශය බලා පිටත්ව යාමට පෙර ලංකාවේ ප්‍රංශ තානාපති කාර්යාලය විසින් මෙහෙයවනු ලබන "ඇලයන්ස් ප්‍රනැන්කාස්" හි ප්‍රංශ භාෂාව පිළිබඳ පුළුල් පාඨමාලාවක් හදාරා අවශ්‍ය ප්‍රවීණත්වය ලබා ගතිවිය යන අපේක්ෂාවෙන් තෝරීම් කරනු ලැබීමට ඉඩ තිබේ.

**සංලක්ෂය 1 :** රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970.5.14 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) ප්‍රංශය බලායාම සහ ආපසු පැමිණීම සඳහා ගමන් වියදම්.

(ආ) මසකට ප්‍රැන්ක් 750 බැගින් දීමනාවක්.

(ඉ) ඉගෙනීමේ වියදම්.

**සංලක්ෂය :** මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපෙක්ෂකයන් ප්‍රංශය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම් ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපෙක්ෂකයන් ප්‍රංශයේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එසින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරා ගනු ලැබූ අපෙක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡෙදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපෙක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපෙක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපෙක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1970.5.14 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන් කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරා ලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 අප්‍රියෙල් මස 23 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

4–987—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

## ලංකා විශ්ව විද්‍යාලය

පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් 1970.5.19 දින තෙක් භාරගනු ලැබේ :—

(1) වැඩපළක (ගොඩනැගිලි)

(2) වැඩපළක (විදුලි).

(3) II වැනි ශ්‍රේණියේ වයර්මන්.

(4) පියදුරු.

(5) ඇක්ටර් ඔපරේටර්.

2. ඉල්ලුම්පත් හා තනතුරු පිළිබඳව තිබිය යුතු සුදුසුකම් ආදිය සඳහන් විස්තර පේරාදෙණිය ලංකා විශ්ව විද්‍යාලයේ ආගතන ශාඛාවේ සහකාර ලේකම්ගෙන් ලබාගත හැකිය.

3. ඉල්ලුම්පත් හා සුදුසුකම් පිළිබඳ විස්තර තැපැල් මගින් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය ඒ සඳහා තමා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන තනතුර පැහැදිලිව සඳහන් කර තමාගේ ලිපිනය සඳහන් ශත 10 ක මුද්දරයක් ඇලවූ, ප්‍රමාණයෙන් අඟල් 9 × 4 ට නොඅඩු ලියුම් කවරයක් එවිය යුතුය.

පේරාදෙණිය, 1970.4.8.

ලේකම්.

4–918—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදේශ දූත මණ්ඩල ඇබෑර්තු

### ලඝු ලේඛක තනතුරු

ලංකා විදේශ දූත මණ්ඩලවල ලඝුලේඛක තනතුරු සඳහා ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ (ඉංග්‍රීසි මාධ්‍ය) ස්වකීය පත්වීම්වල ස්ථිර කරනු ලැබ නිලධාරීන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ හෝ කුඩා පවුල් ඇති විවාහක නිලධාරීන්ගේ අයදුම්පත් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

2. අයදුම් පත් පහත දැක්වෙන උපලේඛනයේ ඇති ආකෘති පත්‍රයේ ආකාරයට විය යුතු අතර ඒවා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. තවද, තෝරාගනු ලැබුවහොත්, දැනට දරණ තනතුරෙන් වහාම මුදා හැරීමට හැකි බවට අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් සටහනක් අයදුම්පත මත විය යුතුය.

3. කලින් විදේශ දූත මණ්ඩල එකකට වැඩි ගණනක සේවය කර ඇති අය ඉල්ලුම්කළ යුතු නැත.

4. මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන නිලධාරීන් විදේශ සේවය සඳහා ශාරීරික වශයෙන් සුදුසුදැයි තීරණය කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට භාජන විය යුතුය. තවද, අවුරුදු හයකට නොවැඩි කාලසීමාවක් විදේශයේ සේවය කිරීමට ඔවුන්ට නියම වනු ඇත. ඔවුන් මේ කාලය තුළ ස්ථාන මාරු වලට යටත් වනු ඇත.

5. මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන නිලධාරීන්ට ඔවුන්ට දැනට දරණ තනතුරට අයත් අනුමාන වැටුපම ලැබෙන අතර ලංකාවේදී ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප වෙනුවට විදේශ දීමනාවක් ගෙවනු ඇත. අන්‍ය සේවා කොන්දේසි විදේශ සේවා සංග්‍රහයේ සලසා ඇති අන්දමට වේ.

6. මීට ඉහත දී මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කොට ඇති අයදුම් පත් සලකා බලනු නොලැබේ.

7. අයදුම්පත් 1970 මැයි 31 වැනි දින හෝ ඊට ප්‍රථම මෙම අමාත්‍යාංශයට ලැබිය යුතුය.

සී. ගුණසිංහම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම් වෙනුවට.

1970 අප්‍රේල් 12 දින,
කොළඹ 1,
සෙනෙට් මන්දිරයේ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නම මුලින්): ————.

2. (අ) උපන් දිනය :————.
 (අ) 1970 මැයි 31 දිනට වයස :————.

3. ලිපිනය : කාර්යාලීය :————.
 පුද්ගලික :————.

4. ජාතිය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. විවාහක නම් දරුවන් සංඛ්‍යාව :————.

7. අධ්‍යාපන සුදුසුකම් :————.

8. (අ) ලඝු ලේඛක සේවයට ඇතුළුවූ දිනය :————.
 (ආ) සේවයේ ස්ථිර කරනු ලැබූ දිනය :————.

9. වර්තමාන වාර්ෂික වැටුප :————.
 (අ) ඒකාබද්ධ :————.
 (ආ) කල්පිත මූලික වැටුප :————.

10. (අ) ලඝු ලේඛන වේගය :————.
 (ආ) ටයිප් ගැසීමේ වේගය :————.

11. දැනට කරන රාජකාරි ස්වභාවය :————.

12. (අ) සිංහල භාෂාවෙහි ඇති ප්‍රවීණතාවය :————.
 (ආ) සිංහල යතුරු ලිවීමේ ප්‍රවීණතාවය :————.

13. වෙනත් සුදුසුකම් :————.

ඉහතින් දී ඇති විස්තර නිවැරදි බවට සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–868—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## කිරි සකස් කිරීමේ කර්මාන්ත ශාලාව—කිරි මණ්ඩලය

### සහකාර ගණකාධිකාරි තනතුර iv වැනි ශ්‍රේණිය

කිරි මණ්ඩලීය සේවයේ iv වැනි ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරී තනතුරක් සඳහා ලාංකිකයින්ගෙන් ඉල්ලුම්පත් භාරගනු ලැබේ. ඉල්ලුම්පත් පහත සඳහන් ආකාරයට සකස් කර, 1970 මැයි මස 25 වැනි දින හෝ ඊට ප්‍රථමයෙන් පහත සඳහන් අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. වැටුප.—මසකට රු. 600—40×10—රු. 1,000 (සියළු දීමනා සහිතව).

3. සුදුසුකම්.—පහත සඳහන් කරුණු වෙනුවෙන් සෑම අයදුම්කරුවෙකුම පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1970 මැයි මස 25 වැනි දිනට අවුරුදු 30 කට නොවැඩි බව ;

(ආ) හොඳ කල් ක්‍රියාවෙන් හා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බව ;

(ඇ) (i) තුන් අවුරුද්දක ගිණුම් පිළිබඳ පළපුරුද්දක් ඇතිව, ගණකාධිකරණය විශේෂ විෂයක් සහිතව ආර්ථික විද්‍යාවෙන් හෝ වාණිජ විද්‍යාවෙන් උපාධියක් ලබා සිටීම හෝ

(ii) තුන් අවුරුද්දක ගිණුම් පිළිබඳ පළපුරුද්දක් ඇතිව ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ

(iv) රජයේ දෙපාර්තමේන්තුවක, රජයේ සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ගිණුම් පිළිබඳ දස අවුරුද්දක පළපුරුද්දක් තිබීම හෝ

(v) ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ මධ්‍යම පරීක්ෂණය සමත් වී සිටීම.

ගණකාධිකරණය පිළිබඳ දස අවුරුද්දක පළපුරුද්දක් ඇති කිරි මණ්ඩලීය ලිපිකරු සේවයේ v වැනි ශ්‍රේණියේ නිලධාරීන්ටද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැක.

4. සේවා කොන්දේසි :

(අ) දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරියෙකු මේ සඳහා තෝරාගනු ලැබුවහොත්, පත්වීම භාරගැනීමට මත්තෙන්, රාජ්‍ය සේවයේ සිය තනතුර ඔහු/ඇය විසින් අත්හල යුතුය. රජයේ අනුමැතිය ඇඩ රාජ්‍ය සේවයේ ඔහුගේ/ඇයගේ තනතුර අත්හලහොත් මණ්ඩලයට බැඳුන අවස්ථාවේදී

විශ්‍රාමවැටුප් සංග්‍රහයේ 48 ඒ ඡේදය යටතේ ඔහුට/ඇයට තිබූ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ රඳවා ගත හැකිය. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවල නියුක්ත නිලධාරීන්ගේ ඉල්ලුම් පත සලකා බලනු ලබන්නේ, 1965 අගෝස්තු මස 20 වැනි දින දරණ මහා භාණ්ඩාගාරයේ අංක 666 දරණ චක්‍ර ලේඛය අනුවයි. මෙකී චක්‍රලේඛය අනුව, සිය නිලධාරියා සේවයෙන් මුදවා හැරිය හැකිදැයි දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් විසින් නිශ්චිත වශයෙන්ම සඳහන් කළ යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද නිලධාරියෙකු නොවේ නම්, පත්වීම දෙනු ලබන දින සිට තුන් අවුරුද්දක් ගතවන තුරු මෙම තනතුර ස්ථිර නොවේ.

(ඇ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසියට අයදුම්කරු යටත්විය යුතුය.

(ඈ) තුන් අවුරුදු කාලය අවසානයේ දී සේවයේ ස්ථිර කිරීම රඳා පවත්නේ වෙනත් කරුණු අතර, රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ අවශ්‍යතාවයක් සපුරාලීම මතය.

5. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :**

මෙය ස්ථිර තනතුරක් වේ. තෝරාගනු ලබන අයදුම්කරු සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබීමට සුදුස්සෙක් වේ.

6. **ඇප :**

තෝරාගනු ලබන අයදුම්කරු ඇප තැබිය යුතුය.

7. **වෛද්‍ය පරීක්ෂණය :**

රාජකාරි භාර ගැනීමට මත්තෙන් තෝරාගනු ලබන අයදුම්කරු වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

8. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න ලියාපදිංචි කළ සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල කායඹියන් සඳහා නිකුත් කරන ලද සහතික හෝ භාර නොගන්නා බව සැලකිය යුතුය).

(ආ) ලබාගත් ඉහළම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් පාසැල් ප්‍රධානියාගෙන් විද්‍යාලයාධිපතිගෙන් හෝ පෞද්ගලික ආචාර්යවරයෙකු ගෙන් හෝ මහාචාර්යවරයෙකුගෙන් විය යුතුය.

(ඈ) කලින් සේවය කළ ආයතනවලදී ඉටු කරන ලද වැඩ හඳුන්වන සහතික.

9. අයදුම්පත් හා ඒ සම්බන්ධව අනෙක් ලියකියවිලි සියල්ලක්ම කිරි මණ්ඩලයේ කිරි සකස් කිරීමේ කර්මාන්ත ශාලාවේ සාමාන්‍යාධිකාරී වෙත හැර මණ්ඩලීය සේවයේ වෙන කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොඑවිය යුතුය.

10. සියළුම ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ.

සාමාන්‍යාධිකාරි,
කිරි සකස් කිරීමේ කර්මාන්ත ශාලාව,
කිරි මණ්ඩලය.

1970 අප්‍රේල් මස 21 දා,
කිරිසකස් කිරීමේ කර්මාන්ත ශාලාව,
කිරි මණ්ඩලය,
නාරාහේන්පිට,
කොළඹ 5.

## කිරි සකස් කිරීමේ කර්මාන්ත ශාලාව—කිරි මණ්ඩලය

### ඉල්ලුම්පත්‍රය—සහකාර ගණකාධිකාරි iv වැනි ශ්‍රේණිය

1. සම්පූර්ණ නම :————.
2. පෞද්ගලික ලිපිනය :————.
3. අයදුම්කරුගේ උපන් දින හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
4. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
5. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)
6. සිංහල සහ/හෝ දෙමළ පිළිබඳ ලබා ඇති දැනුම :————.
7. කලින් ලබා ඇති පළපුරුදුකම් පිළිබඳ විස්තර :————.
8. දැනට කරන රැකියාවේ විස්තර :————.
9. අයදුම්කරුගේ චරිතය ගැන සහතික කළහැකි දෙදෙනෙකුගේ නම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–921—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## අයි. ඇම්. ටී. ඇස්. "ඩෆ්රින්" නෞකාවේ ආධුනිකත්වය සඳහා ඇබෑර්තු

1970. 4. 10 වැනි දිනය සහ අංක 14,901 දරන රජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ පළවූ නිවේදනයට අමතරව, ඉල්ලුම් පත් බාර ගැනීමේ අවසාන දිනය 70. 5. 17 වෙනි දින දක්වා දීර්ඝ කර ඇත. 1969 දෙසැම්බර් මාසයේ අ.පො.ස. (සාමාන්‍ය) විභාගයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවන අපේක්ෂකයන්ගෙන් ද ඉල්ලුම් පත් බාරගනු ලැබේ. ප්‍රතිඵල ප්‍රසිද්ධ කරනු ලැබ, සතියක් ඇතුලත එම අපේක්ෂකයන් විසින් ඔවුන්ගේ විභාග ප්‍රතිඵල පිටපතක් මා වෙත එවිය යුතුය. විභාග දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිඵල නිකුත් නොකිරීමත් ඇතුළුව කවර හේතුවක් නිසා හෝ එසේ ප්‍රතිඵල පිටපතක් මා වෙත එවීමට ඔවුන් අපොහොසත් වුවහොත්, තරඟ විභාගයෙන් සාමාර්ථය ලත් අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයට කැඳවන අවස්ථාවේදී, ඔවුන්ගේ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ස්ථිර ලේකම්,
ජනසතු සේවා අමාත්‍යාංශය.

ජනසතු සේවා අමාත්‍යාංශය,
තැ. පෙ. 500,
මහලේකම් ගොඩනැගිල්ල,
1970 අප්‍රේල් මස 19 දින,
කොළඹ 1.

4–872—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

### II වැනි ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුර

මේ දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ෆෝර්මය අනුව මෙම ඉල්ලුම්පත්‍ර පිළියෙළ කර 70.5.22 වන දින හෝ ඊට පෙර, මහා මාර්ග අධ්‍යක්ෂ, (ආයතන ශාඛාව) කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

2. වැටුප.—මේ තනතුරට නියමිතව ඇත්තේ වර්ෂයකට රු. 4,728 පටන්ගෙන රු. 144 වාර්ෂික වැටුප් වැඩිවීම් සහිතව වර්ෂයකට රු. 6,456 දක්වා වැඩිවී යන වැටුප් ක්‍රමයකි. (ඒකාබද්ධ වැටුප)

3. (i) **සේවයේ යෙදවීමේ නියමයන්.**—මේ තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.

(ii) ඇතුළු වී කෙටි කාලයක් ඇතුලත පත්වීම් භාර ගැනීමට නියම කරනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම් :

(අ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන විභාගයකින් හෝ සමත් වී සිටීම.

(ආ) ගොඩනැගිලිවල විදුලි නිර්මාණ සහ ස්ථාපන වැඩ ගැන සහ පහත සඳහන් කවර දෙයක් ගැන හෝ පළපුරුද්දක් තිබිය යුතුය. උඩුරැහැන් සහ එයට සබැඳි වහරු, උවාරන, යටි බහන්, විදුලි ඔසවනයන්, වතුර පොම්ප, වාසකාසනයන්, අසනිවාරකයන්, එන්ජින් යෙදූ දනවනයන් සහ පරිනාමක උප පොළවල් ගැන රජයේ දෙපාතර්මේන්තුවක හෝ පලාත් පාලන සේවයේ හෝ පිළිගත් වෙළඳ සමාගමක හෝ පරිපාලන තත්ත්වයෙන් අවුරුදු පහකට නොඅඩු කාලයක් සේවය කර තිබීම සහ

(ඇ) (i) ලංකා කාර්මික විද්‍යාලයේ හෝ කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික ආයතනයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් (විදුලි) පිළිබඳ ඇවුරුදු පූර්ණකාලීන පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම හෝ

(ii) විදුලි පෝමන් ආධුනික පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ රජයේ විදුලි දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද III ශ්‍රේණිය සඳහා වූ පළමු වැනි දෙපාර්තමේන්තු විභාගය සමත් වී තිබීම හෝ

(iii) ලන්ඩන් ආයතනයේ "සිටි සහ ගිල්ඩ්ස්" හි විදුලි ඉංජිනේරු ව්‍යවහාර දෙ. ද. සහ එ. ද. විභාගයේ මධ්‍යම ශ්‍රේණියෙන් සමත් වීම හෝ

(iv) ලන්ඩන් ආයතනයේ "සිටි සහ ගිල්ඩ්ස්" හි විදුලි ස්ථාපන සහ වැඩ පිළිබඳ විභාගයේ "බී" සහ "සී" පාඨමාලාවලින් සමත් වීම.

(ඈ) අයදුම්කරුවන් වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 35ට වැඩි නොවිය යුතුයි.

**සටහන :**

රජයේ සේවයේ සිටින ඉල්ලුම් කරුවන් සඳහා වයස් සීමාව බල නොපානු ඇත. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක II ශ්‍රේණියේ විදුලි පෝමන් තනතුරෙහි සේවය කර ඇති ඉල්ලුම්කරුවන් සම්බන්ධයෙන් වයස සහ සුදුසුකම් ගැන නොතකා සලකා බලනු ලැබේ.

**5. සේවා කොන්දේසි :**

පත්වීම වූ කලී රාජ්‍යසේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි යන මේවාට සහ රජය විසින් කලින් කල නිකුත් කරන සෙසු නියෝග හෝ රෙගුලාසිවලටද යටත් වනු ඇත.

6. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකයක් හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරන සහතිකය හෝ බාරගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපන සහ කාර්මික සුදුසුකම් සනාථ කරන සහතික.

(ඇ) සේවය, පළපුරුද්ද ආදිය සනාථ කරන සහතික.

7. ආණ්ඩුවේ නිලධාරීන් විසින් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කරන ලදුව නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් එම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියමිත දිනට පෙර ලැබී තිබුනේ නම් සහ ප්‍රමාදයට සැලකිය යුතු හේතු දක්වමින් ඒවා පිළිගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ කලහොත් පමණකි, ඒවා පිළිගනු ලබන්නේ.

8. ඉල්ලුම් පත්‍ර සහ එයට අදාල වෙනත් යම් ලියවිලිද මහා මාර්ග අධ්‍යක්ෂ, 'ආයතන' ශාඛාවට මිස, දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධ සහ ඊට අදාල පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

එන්. ජී. වික්‍රමසිංහ,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1970.4.18.

## ආදර්ශ ඉල්ලුම්පත්‍ර පෝර්මය

**මහා මාර්ග දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ විදුලි පෝමන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)
(අ) පෙලපත් නම :————.
(ආ) වෙනත් නම් :————.
2. ලිපිනය :————.
3. (අ) උපන් දිනය සහ ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
(ආ) 1970.5.22 වෙනි දිනට වයස : අවුරුදු :——. මාස :——.
4. ජාතිය :————.
5. උපන් ස්ථානය :————.
(අ) අයදුම්කරුගේ පියාගේ :————.
(ආ) අයදුම්කරුගේ පියපස සීයාගේ :————.
(ඇ) අයදුම්කරුගේ පියපස සීයාගේ පියාගේ :————.
6. දැනට යම් තනතුරක් දරන්නේ නම්, එය කුමක්ද යන්න සහ එහි වැටුප් විස්තර දක්වන්න :————.
7. අධ්‍යාපන සුදුසුකම් (සමත් කල විභාග සඳහන් කරන්න) : ————.
8. කාර්මික සුදුසුකම් (සමත් කළ විභාග සඳහන් කරන්න) : ————.
9. විදුලි නිර්මාණ සහ ස්ථාපන වැඩ ගැන පළපුරුද්ද සහ පත්වීම ආදිය ගැන විස්තර :————.

මා විසින් ඉහත සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි අඩංගු යම්කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි හෝ බව සොයා ගනු ලැබුවහොත්, තේරීමට කලින් මා නුසුදුසු වීමටත්, පත්වීමෙන් පසුව එම ප්‍රමාද දෝෂය අනාවරණය වුවහොත්, කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමටත් මා යටත් වන බවද දනිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

4-982—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ආයතනයේ සහකාර පෝර්මන් තනතුර

මහා මාර්ග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ආයතනයේ සහකාර පෝර්මන් තනතුර සඳහා ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර 1970.5.22 වැනි දින හෝ ඊට පෙර හෝ මහා මාර්ග අධ්‍යක්ෂක, "ආයතන ශාඛාව මහා මාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ 1" යන ලිපිනයට ලැබෙනසේ ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහා එවන ලියුම් කවරයේ ඉහල වම් කෙලවරේ "පර්යේෂණ ආයතනයේ සහකාර පෝර්මන් තනතුර සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුන බව දැනුම් දෙනු නොලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—රු. 4,152 න් පටන් ගෙන රු. 144 වාර්ෂික වැඩිවීම් 16 කින් රු. 6,456 දක්වා වැඩිවන වාර්ෂික වැටුපක් හිමිවේ. රු. 5,304 ලැබීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. (ඒකාබද්ධ වැටුප)

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතවේ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

4. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි යන මේවාට සහ රජය විසින් කලින් කල නිකුත් කරන සෙසු නියෝග හෝ රෙගුලාසිවලටද යටත් වනු ඇත.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයකුම තමා පහත සඳහන් අවශ්‍යතාවයන්ගෙන් යුක්ත බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1970.5.22 වැනි දිනට වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, 35 ට වැඩි නොවිය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම් කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ආ) (i) ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහ භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව විෂයන් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ii) සිංහල/දෙමළ භාෂාව, ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහ භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව ඇතුලත්ව විෂයයන් හයකින් දෙකකට නොවැඩි වාර ගණනකදී පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ සමත් වී තිබීම.

(ඉ) පස් සහ සනාවූ පස් තට්ටුවල ආදර්ශ කොටස් පරීක්ෂා කිරීම සහ සටහන් තබා ගැනීම ඇතුලුව පස් සහ සනාවූ පස් පිළිබඳ ගවේෂන සඳහා මාධ්‍ය මිනුම් උපකරණ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අවුරුදු 5 කට නොඅඩු පළ පුරුද්දක් ලබා තිබීම.

සටහන.—සිවිල් ඉංජිනේරු විද්‍යාවට අදාලව ඇති, රසායනාගාර පස් පරීක්ෂණ ක්‍රම ගැන දැනුමක් ඇති අපේක්ෂකයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

(ඊ) යහපත් චරිතයකින් හා හොඳ ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් යුතු බව.

6. ඉල්ලුම් කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුනා එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකයක් හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරන සහතිකය භාරගනු නොලැබේ.)

(ii) තමා සතුව ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික.

(iii) කාර්මික සුදුසුකම් සනාථ කරන සහතික.

(iv) මුලින් ඇරු පත්වීම් සහ පලපුරුද්ද පිළිබඳ සහතික.

(v) චරිතය පිළිබඳ මෑතදී ලබා ඇති සහතික දෙකක්, (දැනටමත් රජයේ සේවයේයෙදී සිටින නිලධාරීන් විසින් මේ උප වගන්තිය යටතේ ඉල්වා ඇති සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.)

7. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් සිය ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එවැනි ඉල්ලුම් පත්‍ර නියමිත දිනයට පසුව මේ කාර්‍යාලයට ලැබුනහොත් භාර නොගන්නවා ඇත. එහෙත්, ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත ඒවා කල් ඇතිව ලැබී එසේ ප්‍රමාද වීමට හේතු වූ කරුණු සඳහන් කර ඒවා භාරගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ කර සිටිතොත් භාරගනු ලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධ සහ ඊට අදාල පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. මෙයට සම්බන්ධව ඇති ඉල්ලුම් පත්‍ර හෝ වෙනත් ලියවිලි හෝ ඉහත I වන ඡේදයේ සඳහන් ලිපිනයට මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධාරියෙකුගේ පුද්ගලික ලිපිනයකට නොඑවිය යුතුය.

එන්. ජී. වික්‍රමසිංහ,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1970.4.18,
කොළඹ, මහාමාර්ග දෙපාර්තමේන්තුවේදීය.

## ආදර්ශ අයදුම් පත

### මහාමාර්ග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ආයතනයේ සහකාර ෆෝර්මන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. (i) නම මුල් අකුරු සමග :————.
(ii) සම්පූර්ණ නම ::————.

2. ලිපිනය :————.

3. (i) උපන් දිනය :————.
(ii) 1970.5.22 දිනට වයස :————.

4. (i) ජාතිය :————.
(ii) ලාංකික වන්නේ උත්පත්තියෙන්ද ලියා පදිංචි කිරීමෙන්ද :————.

5. උපන් ස්ථානය :————.
(i) අයදුම් කරුගේ :————.
(ii) ඔහුගේ පියාගේ :————.
(iii) ඔහුගේ පිය පස මුත්තාගේ :————.
(iv) ඔහුගේ පිය පස මී මුත්තාගේ :————.

6. අධ්‍යාපනික සුදුසුකම් :————.

7. පස් සහ සතවූ පස් තට්ටුවල ආදර්ශ කොටස් පරීක්ෂා කිරීම සහ සටහන් තබා ගැනීම ඇතුලුව පස් සහ සතවූ පස් පිළිබඳ ගවේෂන සඳහා මාධ්‍ය මිණුම් උපකරණ පාවිච්චි කිරීම පිළිබඳ පළපුරුද්ද :————.

8. වෙනත් සුදුසුකම් :————.

9. දැනට මත් රැකියාවක් කරන්නේ නම් :—.
(i) යෙදී සිටින තනතුර :————.
(ii) ආයතනය :————.
(iii) වැටුප් විස්තර :————.

මවිසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බව හා නිවැරදි බව සහතික කරමි. එම තොරතුරු අසත්‍ය බව තෝරා ගැනීමට පෙර ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් කිසිම වන්දියක නොමැතිව සේවයෙන් පහ කිරීමට හැකි බවත් මම දනිමි .

................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–981—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සහා ප්‍රදේශයේ අතිරේක හදිසි මරණ පරීක්ෂක ධූරය

කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා ප්‍රදේශයේ අතිරේක හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරමි. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරණ ලද අයදුම්පත් 1970 මැයි මස 30 වැනි දිනට පෙර, ආණ්ඩුවේ ඒජන්ත කච්චේරිය, කොළඹ යන ලිපිනයට එවිය යුතුයි.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නො ලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නො අඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහත කී කොළඹ නගර සභා සීමාවේ ස්ථිර පදිංචි කරුවකුවීම.

(ඈ) (1) 1925 සිට (1944 කාලයෙහි සිංහල පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම හෝ,

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගයකින් සමත් වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය.
(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.
(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධූරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන්ද අයදුම්පත් භාරගනු නොලැබේ.

6. අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු අතර ඒවා ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ.

ඩී. ආර්. උමගිලිය,
ආණ්ඩුවේ ඒජන්ත.

1970 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ දිසාපති කාර්යාලයේ දීය.

### කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා ප්‍රදේශයේ අතිරේක හදිසි මරණ පරීක්ෂක ධූරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපනික සුදුසුකම් :————.

7. දැනට කරණ රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. අයදුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද?

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවරදි බවත් මෙයින් සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–897—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

### මායා මාවත "ඒ" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති ධුරය

කොළඹ 5, මායා මාවත උප තැපැල් කාර්යාලයට උප තැපැල් ස්ථානාධිපතිවරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. අඩුම මාසික දීමනාව රු. 75 කි.

1. 1970.5.30 දින ඉල්ලුම්කරුවන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම වයස අවුරුදු 21 ට වැඩි සහ අවුරුදු 45 ට අඩු ලාංකිකයන් විය යුතුයි.

2. ඉල්ලුම්කරුවන් අවුරුදු 10ක් හෝ ඊට වැඩි කාලයක සිට නගර සහ ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. උප තැපැල් කාර්යාලය පිහිටි නගර සහා කොට්ඨාශය තුළ සහ යාබද කොට්ඨාශවල පදිංචි අයදුම්කරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. ඉල්ලුම්කරුවන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/මූලික ගණිතය ඇතුළුව අඩු වශයෙන් විෂයයන් තුනකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික විභාගය/අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය සමත්වී තිබිය යුතුයි.

4. මායා මාවත උප තැපැල් කාර්යාලය පවත්වාගෙන යෑමට සුදුසු ගොඩනැගිල්ලක් කුලී රහිතව ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි.

5. කොළඹ 1, ඇච්ලන් චතුරශ්‍රයේ අංක 5 දරණ ගොඩනැගිල්ලේ පිහිටි (බටහිර දකුණ) කොට්ඨාශයේ ප්‍රදේශීය තැපැල් අධිකාරිතුමාගෙන් ඉල්ලුම් පත් සඳහා මුද්‍රිත ෆෝර්ම ලබාගෙන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 70. 5. 30 දින හෝ ඊට ප්‍රථම ඔහු වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

තවදුටත් විස්තර අවශ්‍ය නම් ප්‍රදේශීය තැපැල් අධිකාරිතුමාගෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

4–926—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

### ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනය

#### උපාධිධාරී පුහුණුවන්නකු බඳවා ගැනීම

ගෞරව උපාධියක් සහිතව ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය සමත් උපාධිධරයෙකු පුහුණුවීම සඳහා බඳවා ගැනීමට ආයතනය අදහස් කරයි. 1970 මැයි 22 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 26 ට නොවැඩි අවශ්‍ය සුදුසුකම් ඇති උපාධිධාරීන්ට ඉල්ලුම් කරන ලෙස ආරාධනා කෙරේ. පුහුණුවීමේ කාලසීමාව තුලදී රු. 500 ක ස්ථිර මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

නම ලිපිනය සහිතව අඟල් 9×4 ප්‍රමාණයේ මුද්‍රිත ලියුම් කවරයක් ලැබුණු පසුව කාර්යාල සහායක විසින් සම්පූර්ණ විස්තර සපයනු ඇත. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1970 මැයි 22 වැනිදාය.

සාමාන්‍යාධිකාරී.

තැ. පෙ. 20, 292, ගාලු පාර,
කොළඹ 3, 1970 අප්‍රේල් 22 වැනිදා.

4–986—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### කොළඹ රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට ශිෂ්‍යයින් බඳවා ගැනීම—1970-71 වර්ෂය

කොළඹ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය කලානිධි ඩී. ඒ. ඇම්. ඇස්. උපාධි පාඨමාලාවට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍ර භාරගනු ලැබේ. මෙම පාඨමාලාව හැදෑරීමට කැමති අයවලුන් විද්‍යාලය මඟින් නිකුත් කරනු ලබන නියමිත ඉල්ලුම්පත්‍ර නිසි අයුරින් සම්පූර්ණ කර 1970 මැයි මස 31 වෙනි දිනට හෝ ඊට ප්‍රථම පහත දැක්වෙන ලිපිනයට ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලිපිනය :

ලේඛකාධිකාරි,
ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය,
බණ්ඩාරනායක පුර,
රාජගිරිය.

අවශ්‍ය ඉල්ලුම්පත්‍ර මැයි මස 20 වෙනි දින දක්වා පැමිණ හෝ තැපෑලෙන් හෝ මෙම විද්‍යාලයෙන් ලබාගත හැකිය. තැපෑලෙන් ලබා ගැනීම සඳහා නම ලිපිනය ලියන ලද (මුද්දර රහිත) කවරයක් එවිය යුතුය.

2. **ඉගැන්වීමේ මාධ්‍යය :**

වෛද්‍ය කලානිධි ඩී. ඒ. එම්. එස්. උපාධිය සඳහා විද්‍යාලයේ අධ්‍යයන පාඨමාලාව තෙවැදෑරුම් වේ.

(අ) ආයුර්වේද පාඨමාලාව.

(ආ) සිද්ධ පාඨමාලාව.

(ඇ) යුනානි පාඨමාලාව.

ආයුර්වේද පාඨමාලාව ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අනුව සිංහල භාෂාවෙන්ද, සිද්ධ පාඨමාලාව සිද්ධ වෛද්‍ය ක්‍රමය අනුව දෙමළ භාෂාවෙන්ද, යුනානි පාඨමාලාව යුනානි වෛද්‍ය ක්‍රමය අනුව ඉංග්‍රීසි භාෂාවෙන්ද උගන්වනු ලැබේ.

3. ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම (නියමිත සුදුසුකම් ඇති නම්) පාඨමාලාවට ඇතුලත්වීම සඳහා ඉල්ලුම් කළ හැකිය. **පූජ්‍ය පක්ෂයෙන් ලැබෙන අයදුම්පත්‍ර පමණක් භාරගනු නොලැබේ.**

4. **වයස :**

1970 ඔක්තෝබර් මස 1 වෙනි දිනට අවුරුදු 17 ට නොඅඩු විය යුතුයි.

5. **අධ්‍යාපන සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙක්ම යටත් පිරිසෙයින්,

(i) අ. පො. ස. (සාමාන්‍ය) විභාගයේදී,

(අ) භාෂාව (ආයුර්වේද පාඨමාලාව සඳහා සිංහල භාෂාවද, සිද්ධ පාඨමාලාව සඳහා දෙමළ භාෂාවද, යුනානි පාඨමාලාව සඳහා ඉංග්‍රීසි භාෂාවද විය යුතුයි.)

(ආ) අංක ගණිතය/ගණිතය/ව්‍යවහාරික ගණිතය/උසස් ගණිතය ඇතුළුව, පහත ලැයිස්තුවේ සඳහන් විෂයන් 6 කින් සමත්ව සිටිය යුතුයි. එම විෂයන්ගෙන් පහකින් එක්වර සමත්ව සිටිය යුතු අතර, (පහත ලැයිස්තුවේ පරිදි) විෂයන් තුනක් සඳහා සම්මාන ලබා සිටිය යුතුයි.

සහ

(ii) (අ) අ. පො. ස. (උසස්) විභාගයේදී, විෂයන් දෙකකින් සමත්ව සිටිය යුතුයි.

නැතහොත්

(ආ) අ. පො. ස. (සාමාන්‍ය) විභාගයේදී, පහත සඳහන් විෂයන්ගෙන් තුනක් සඳහා සම්මාන සාමාර්ථ්‍ය ලබා සිටිය යුතුයි. අ. පො. ස. (උසස් පෙළ) සාමාර්ථ්‍ය අ. පො. ස. (සාමාන්‍ය) සම්මාන වෙනුවට පිළිගනු ලැබේ.

(සංස්කෘත, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව හා සත්ව විද්‍යාව).

**සටහන :**

විභාගවලට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අයගෙන්ද ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ. එහෙත් විද්‍යාලයට ඇතුළු කර ගන්නා දිනට පෙර ඉහත සඳහන් සුදුසුකම් නොලැබුවහොත් විද්‍යාලයට ඇතුලත් කර ගනු නොලැබේ.

#### ඉහත 1 (ආ) වගන්තියෙහි සඳහන් විෂය ලැයිස්තුව

(1) සිංහල භාෂාව (2) සිංහල සාහිත්‍ය (3) දෙමළ භාෂාව (4) දෙමළ සාහිත්‍ය (5) ඉංග්‍රීසි භාෂාව (6) ඉංග්‍රීසි සාහිත්‍ය (7) අරාබි භාෂාව (8) මලයාලි භාෂාව (9) පාලි භාෂාව (10) සංස්කෘත (11) උර්දු (12) වංග (13) අංක ගණිතය (14) ගණිතය (15) ව්‍යවහාරික ගණිතය (16) උසස් ගණිතය (17) භෞතික විද්‍යාව (18) රසායන විද්‍යාව (19) උද්භිද විද්‍යාව (20) සත්ව විද්‍යාව (21) ජීව විද්‍යාව (22) බුද්ධ ධර්මය (23) හින්දු ධර්මය (24) ඉස්ලාම් ධර්මය (25) ක්‍රිස්තියානි ධර්මය (26) ඉතිහාසය (27) භූගෝල විද්‍යාව (28) ප්‍රජා

චාරය (29) කෘෂිකර්ම විද්‍යාව (30) ආර්ථික විද්‍යාව (31) සෞඛ්‍ය විද්‍යාව (ස්වස්ථාව හා ශරීර විද්‍යාව) (32) සාමාන්‍ය විද්‍යාව (33) චිත්‍ර කර්මය (34) විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලය මගින් අනුමත කරනු ලබන වෙනත් විෂයයන්.

**විශේෂය :**

පරම්පරා තුනකට නොඅඩු කාලයක් පැරණි වෛද්‍ය පරම්පරාවලින් පැවත එන ආයුර්වේද වෛද්‍යවරුන්ගේ දරුවන් අ. පො. ස. සාමාන්‍ය විභාගයෙන් සම්මාන තුනක් සහිතව භාෂාව හා ගණිතය ඇතුළු ඉහත සඳහන් විෂයන් 6 කින් සමත්ව සිටී නම්, ඔවුනට ඇතුලත් වීමේ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

6. **ප්‍රවේශ පරීක්ෂණය :**

ඉහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින් අතුරෙන් විද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රවේශ පරීක්ෂණයක මාර්ගයෙන් තෝරා ගනු ලැබේ. ඇතුලත් වීමේ විභාග පරිපාටිය පහත සඳහන් පරිදි වේ :—

(අ) වාක්‍ය රචනය (පැ. 1½) ... ලකුණු 200 යි.
(ආ) භාෂාව (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) (පැ. 1) ලකුණු 100 යි.
(ඇ) සාමාන්‍ය දැනුම (වෛද්‍ය විද්‍යාවට අදාල) (පැ. 1½) ලකුණු 100 යි.

**සටහන :**

(i) ආයුර්වේද පාඨ්‍ය මාලාව සඳහා සිංහල භාෂාවද, සිද්ධ පාඨ්‍ය මාලාව සඳහා දෙමළ භාෂාවද, යුනානි පාඨ්‍ය මාලාව සඳහා ඉංග්‍රීසි භාෂාවද පරීක්ෂණයේ මාධ්‍යය වන්නේ ය.
භාෂාව පිළිබඳ ප්‍රශ්න පත්‍රය අ. පො. ස. (සාමාන්‍ය) පෙළ විභාගයේ භාෂාව ප්‍රශ්න පත්‍රයට වඩා මඳක් උසස් ය.

(ii) ලිඛිත පරීක්ෂණයේ සෑහෙන තත්වයක් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් පමණක් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

7. ඇතුලත් වීමේ පරීක්ෂණය ජූලි මස මුල් සතියේ දී පමණ පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. විභාගය පවත්වන දිනය හා ස්ථානය පසුව දන්වනු ලැබේ.

**8. සෑම ඉල්ලුම් පත්‍රයකම, රු. 15 ක් වටිනාකම ඇති මුද්දර අලවා මෙහි පහත 13 වැනි ඡේදයෙහි සඳහන් නිලධාරියෙකු ඉදිරිපිටදී අත්සන් තබා සහතික කර ගත යුතු ය. කොනම හේතුවක් නිසාවත් මුද්දර ගාස්තු ආපසු ගෙවනු නො ලැබේ.**

9. අයදුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුය :—

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කළ උප්පැන්න සහතිකය.
(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.
(සහතිකවල මුල් පිටපත් නොඑවිය යුතුයි.)

10. **හැඳින ගැනීමේ පත්‍ර :**

(අ) සියලුම අපේක්ෂකයන් විසින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින එක් එක් විෂයක් වෙනුවෙන් තමන් හැඳින ගත හැකි පරිදි සාධක ඉදිරිපත් කළ යුතුයි. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සෑහේ.
(1) පෝස්ට් මාස්ටර් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද හැඳින ගැනීමේ පත්‍රයක්.
(2) විභාගය පවත්වන දිනට පෙර අවුරුදු 5 ක් ඇතුලත, රජයේ දෙපාර්තමේන්තුවක් විසින් නිකුත් කරන ලද තමාගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බලපත්‍රයක්.

(ආ) තමන් හැඳින ගැනීමට සුදුසු සාධක ඉදිරිපත් නොකරනු ලබන අපේක්ෂකයින්ට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.

11. **ඇතුලත් වීමේ ගාස්තු :**

විද්‍යාලයට ඇතුලත් කර ගනු සඳහා තෝරා ගන්නා ලද ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලය මගින් අනුමත කරන ලද ලියාපදිංචි වීමේ ගාස්තු වශයෙන් රු. 10 ක් ද, පුස්තකාල, රසායනාගාර, චිකිත්සාගාර තැන්පත් මුදල් වශයෙන් රු. 30 ක් ද ගෙවිය යුතුය.

12. **ව්‍යවස්ථා හා නිර්දේශ මාලාව :**

විද්‍යාලයේ නව ව්‍යවස්ථා හා නිර්දේශ මාලාව මුද්‍රණය කරවීමට කටයුතු කර තිබෙන බැවින් දැන්ම එය ලබාගත නොහැක. අවශ්‍ය නම් පැරණි ව්‍යවස්ථා හා නිර්දේශ මාලාව විද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් ලබා ගත හැකිය. පිටපත් තැපැලෙන් ලබා ගැනීම සඳහා ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ලේඛකාධිකාරී නමට නියමිත මුදල සඳහා පෝස්ටල් / මනිඔඩරයක් එවිය යුතුය. පිටපතක මිල ශත 70 කි. සාමාන්‍ය තැපැලෙන් ශත 90 යි. ලියාපදිංචි තැපැලෙන් රු. 1.40 කි.

13. සෑම අයදුම්කරුවෙකු විසින්ම තම අත්සන මෙහි පහත දක්වා ඇති නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය.

(i) සමාදාන විනිශ්චයකාරවරයකු.
(ii) පාඨශාලා ප්‍රධානාචාර්යවරයකු හෝ
(iii) වර්ෂයකට රු. 2,400ක මූලික වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු.

14. **පාඨමාලාව :**

වෛද්‍ය කලානිධි (බී. ඒ. එම්. එස්.) උපාධි පාඨමාලාව සඳහා අධ්‍යයන කාලය මෙහි පහත සඳහන් පරිදි අවුරුදු 5 කින් යුක්ත වේ.

(i) **පළමුවැනි බී. ඒ. ඇම්. ඇස්. පරීක්ෂණය :** (පළමුවන වසර)
නියමිත විෂයයන්.
(1) සංස්කෘත/උර්දු.
(2) රසායන විද්‍යාව.
(3) භෞතික විද්‍යාව.
(4) උද්භිද විද්‍යාව.
(5) සත්ව විද්‍යාව.
(6) මූලධර්ම ආයුර්වේද සිද්ධ යුනානි
(උර්දු භාෂාව යුනානි අංශයේ ශිෂ්‍යයන් උදෙසා.)

(ii) **දෙවෙනි බී. ඒ. ඇම්. ඇස්. පරීක්ෂණය I වැනි කොටස:** (දෙවෙනි වසර)
නියමිත විෂයයන්.
(1) ද්‍රව්‍ය ගුණ විඥානය—I වැනි කොටස.
(2) කාය විද්‍යාව (නූතන)—I වැනි කොටස.
(3) ශරීර ක්‍රියා විද්‍යාව (නූතන)—I වැනි කොටස.
(4) රස ශාස්ත්‍රය හා භෛෂජ්‍ය කල්පනා.
(5) ස්වස්ථවෘත්ත හා මහජන සෞඛ්‍ය.
(6) සංස්කෘත/උර්දු.

(iii) **දෙවෙනි බී. ඒ. ඇම්. ඇස් පරීක්ෂණය II වැනි කොටස:** (තුන්වන වසර)
නියමිත විෂයයන්.
(1) ද්‍රව්‍ය ගුණ විඥානය—II වැනි කොටස.
(2) කාය විද්‍යාව (නූතන)—II වැනි කොටස.
(3) ශරීර ක්‍රියා විද්‍යාව (නූතන)—II වැනි කොටස.
(4) නිදාන—I වැනි කොටස.
(5) චිකිත්සා—I වැනි කොටස.

(iv) **අවසාන බී. ඒ. ඇම්. ඇස්. පරීක්ෂණය I වැනි කොටස:** (හතර වැනි වසර)
නියමිත විෂයයන්.
(1) කෞමාර භෘත්‍ය සහ ස්ත්‍රී රෝග.
(2) රෝගි විඥාන විධි (නව්‍ය).
(3) අගද (ආයුර්වේද).
(4) විකෘති විඥානය.
(5) චිකිත්සා—II වැනි කොටස.
(6) නිදාන—II වැනි කොටස.

(v) **අවසාන බී. ඒ. ඇම්. ඇස්. පරීක්ෂණය II වැනි කොටස:** (පස්වන වසර)
නියමිත විෂයයන්.
(1) නිදාන—3 වැනි කොටස.
(2) චිකිත්සා—3 වැනි කොටස.
(3) ශල්‍ය හා ශාලාක්‍ය.
(4) ප්‍රසවවිධි විද්‍යාව.
(5) අධිකරණ වෛද්‍ය විද්‍යාව.
(6) රෝග පරීක්ෂා—ප්‍රායෝගික.

ඉහත සඳහන් පරීක්ෂණ ලිඛිත හා වාචික වශයෙන් කොටස් දෙකකි. සංස්කෘත/උර්දු යන භාෂා විෂයනට වාචික පරීක්ෂණයක් නැත.

15. විද්‍යාලයට ඇතුලත් කර ගැනීමට පෙර හෝ ඇතුලත් කර ගැනීමෙන් පසු හෝ අයදුම්කරුවන් විසින් යම් අසත්‍ය කරුණු දක්වා ඇති බව් ඒත්තු ගියහොත් ඔහු හෝ ඇය විද්‍යාලයෙන් අස් කරනු ලැබේ.

ඇල්. ඇන්. ප්‍රනාන්දු,
ලේඛකාධිකාරී.

1970 අප්‍රේල් මස 20 දින,
රාජගිරිය, බණ්ඩාරනායක පුර,
ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ දී ය.

4–924—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාර අංකය : 1/84/22 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ ඉහළ ශ්‍රේණියට කුශලතා මත උසස් කිරීම

ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් පහත නම් සඳහන් ලඝු ලේඛකයා කුශලතා මත ඉහළ ශ්‍රේණියට උසස් කිරීම සඳහා තෝරාගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| ප්‍රනාන්දු, ජේ. ජේ. අයි. එල් | ... | අධිකරණ අමාත්‍යාංශය. |

ප. බ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1970 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ,
මහා භාණ්ඩාගාරයේ දීය.

4-863—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාර අංකය : 1/102/21 (ජී)

## වාර්ෂික වැටුප රු. 6,600—180×8 හා 240×5—රු. 9,240 (වාර්ෂික වැටුප රු. 8,280 ට පෙර කාර්යක්ෂමතා කඩඉම සහිත) වැටුප් ක්‍රමයට උපාධිධාරී භාෂා පරිවර්තකයන් උසස් කිරීම සඳහා 1970 ජනවාරි මස 31 වැනි දින පැවැත්වූ විභාගය

පහත නම් සඳහන් උපාධිධාරී භාෂා පරිවර්තිකාව ඉහත සඳහන් විභාගයෙන් සමත්වී ඇති බව දැනුම් දෙමි.

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| කන්තයියා, ආර්. (මෙනෙවිය) | — | පළාත්පාලන අමාත්‍යාංශය |

ප. බ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1970 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

4-864—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සමාජ සේවා විද්‍යාලය

### සමාජ සුභසාධනය හා ප්‍රජා වැඩ පිළිබඳ කෙටිකාලීන පරිපූරක පාඨමාලාව

1970 ජූනි හා ජූලි මාසයන්හි සමාජ සුභසාධනය හා ප්‍රජා වැඩ සම්බන්ධව කෙටිකාලීන පරිපූරක පාඨමාලාවක් ලංකා සමාජ සේවා විද්‍යාලය මගින් පවත්වනු ලැබේ.

2. මෙම පාඨමාලාව 1970 ජූනි මස 6 වන දින පටන් ගන්නා අතර පෝය දිනට පසු සෑම 2 වැනි හා 3 වැනි දිනයන්හි සවස 4.30 සිට 6.30 දක්වා දේශන පවත්වනවා ඇත.

3. අයදුම්කරුවන් යටත් පිරිසෙයින් අධ්‍යයන පොදු සහතිකපත් (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් 5 කින් හෝ ඒ හා සමාන විභාගයකින් සමත්වී සිටිය යුතු අතර, සමාජ සුභසාධනය හෝ ප්‍රජා වැඩ සම්බන්ධව අවුරුදු 5 ක පළපුරුද්දක් ද ලබාතිබිය යුතුය.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍රයන්හි නම, ලිපිනය, වයස, අධ්‍යාපන සුදුසුකම් සහ ලබා ඇති පළපුරුද්ද සටහන් කර ඒවා ආයතන ප්‍රධානීන් මගින් ඔවුන්ගේ නිර්දේශ සමග 1970.5.15 වැනි දිනට ප්‍රථම කොළඹ 3, 5 වැනි පටුමග, අංක 82 දරණ ස්ථානයේ ලංකා සමාජ සේවා විද්‍යාලයේ ලේකම් වෙත එවිය යුතුය.

ඒ. එම්. එම්. සහාබ්දීන්,
සමාජ සේවා අධ්‍යක්ෂ.

1970 අප්‍රේල් 12 වන දින,
කොළඹ 3, 5 වැනි පටුමග, අංක 82,
ලංකා සමාජ සේවා විද්‍යාලයේ දීය.

4-954—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## සුරාබදු දෙපාර්තමේන්තුව

### ඉන්දියානු ආධාර යටතේ ආනයන කළයුතු ගේජ් 10 මළ නොබැඳෙන වානේ වලින් ගැලුම් 4,000 හේ වැන්කි 10 ක් තනා භාරදීම

ඉන්දියානු ආධාර යටතේ ආනයනය කළයුතු, ගේජ් 10 මළ නොබැඳෙන වානේ වලින් ගැලුම් 4,000 හේ මළ නොබැඳෙන වානේ ටැන්කි 10 ක් තනා භාරදීම සඳහා කොළඹ 7, සුරාබදු දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මැයි මස 25 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර 1970 මැයි මස 25 වැනි දින පෙ. ව. 10.30 ට කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ සුරාබදු කොමසාරිස් කාර්යාලයේදී විවෘත කරනු ඇත.

3. ටෙන්ඩර් ඉදිරිපත් කළයුත්තේ නියමිත ආකෘතිපත්‍රවලය. එම ආකෘතිපත්‍ර 1970 මැයි මස 23 වැනි දින ප. ව. 3 දක්වා සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයෙන් ඉල්ලුම්කර ලබාගතහැක.

4. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගැනීමට පළමු ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100ක් සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

5. සියළුම ටෙන්ඩර්, පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර්පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ " ඉන්දියානු ආධාර යටතේ ආනයනය කළයුතු ගේජ් 10, මළ නොබැඳෙන වානේ වලින් ගැලුම් 4,000 මළ නොබැඳෙන වානේ ටැන්කි 10 ක් තනා භාරදීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් සඳහන් කළයුතුය.

6. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය හැකිය. කිසියම් ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය තැපෑලෙන් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩරය පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින් ප්‍රධාන සුරාබදු කාර්යාලයේ සුරාබදු අධිකාරී, එල්. ආර්. ගුණරත්න මහතාට භාරදිය හැක. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට හා ඒවා ලැබුණ බව දැන්වීමට ඔහුට බලය පවරා ඇත. එබඳු අවස්ථාවලදී ඉහත 5 වන ඡේදයේ සඳහන් විස්තරද ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය.

සියළුම ටෙන්ඩර්පත්‍ර බහා එවන කවර මුද්‍රා තබා තිබිය යුතුය.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කාර්යාලය,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970.4.23.

4-978—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### අඟල් 190 රෝද පරතරය ඇති ඩීසල් ලොරි 3 ක් ඉන්දියානු ආධාර යටතේ සිදුවේ රජයේ ස්කාගාරයට සැපයීම සඳහා ටෙන්ඩර්

අඟල් 190 රෝද පරතරය ඇති ඩීසල් ලොරි 3 ක් ඉන්දියානු ආධාර යටතේ සිදුවේ රජයේ ස්කාගාරයට සැපයීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මැයි මස 25 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර 1970 මැයි මස 25 වැනි දින පෙ. ව. 10.30 ට කොළඹ 7 ටොරින්ටන් චතුරශ්‍රයේ සුරාබදු කොමසාරිස් කාර්යාලයේදී විවෘත කරනු ඇත.

3. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ නියමිත ආකෘතිපත්‍ර වලය. එම ආකෘතිපත්‍ර 1970 මැයි මස 23 වැනි දින ප. ව. 3 දක්වා සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයෙන් ඉල්ලුම්කර ලබා ගතහැක.

4. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගැනීමට පළමු ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100ක් සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත්කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළයුතුය.

5. සියළුම ටෙන්ඩර්, පිටපත් දෙකකින් යුක්ත වියයුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ " අඟල් 190 රෝද පරතරය ඇති ඩීසල් ලොරි 3 ක් ඉන්දියානු ආධාර යටතේ සිදුවේ රජයේ ස්කාගාරයට සැපයීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් සඳහන් කළයුතුය.

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

පහත සඳහන් ස්ථානයන්හි විදුලි බල පෝෂ කර්මාන්ත ශාලාවල විශ්‍රාම කාමර ඉදි කිරීම සඳහා කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1970 මැයි මස 23 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ:—

(1) බන්ඩාරවෙල,

(2) මහගස්තොට.

2. යම්කිසි දෙපාර්තමේන්තුවක රු. 25,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැක.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් එක් වැඩකට රු. 100 බැගින් ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1970 මැයි මස 22 වන දින පෙරවරු 12 ට පෙර කුවිතාන්සි හා ලියා පදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

ලුවී ගුණවර්ධන,
අධ්‍යක්ෂක,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත
දෙපාර්තමේන්තුව.

යොමුව : සීඑ/ සී/198 සහ සීඑ/ සී/200.
1970 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ 7.

4–884—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කුණ්ඩසාලේ බලවේග පෙහෙකම් හලෙහි පැති බැම්මක් ඉදි කිරීම සඳහා කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ, ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1970 මැයි 23 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි දෙපාර්තමේන්තුවක රු. 10,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියා පදිංචිවී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැක.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමැති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100 බැගින් ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක, හෝ තැන්පත් කොට 1970 මැයි මස 22 වන දින පෙරවරු 12ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර්පත් ලබා ගත යුතු වේ.

ලුවී ගුණවර්ධන,
අධ්‍යක්ෂක,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව.

යොමුව : සීඑ / සී/201.

1970 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ 7.

4–883—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පට්ටි මධ්‍යස්ථාන ඉදි කිරීම

මෙහි පහත සඳහන් ස්ථානවල ඇති පට්ටි මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදි කිරීම සඳහා කොළඹ-5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.6.1 දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. එක් එක් ස්ථානයට යටත් ව ඇති ගොඩනැගිලි සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු අතර එක් ස්ථානයක් වෙනුවෙන් හෝ ස්ථාන කිහිපයක් වෙනුවෙන් හෝ ටෙන්ඩර් කිරීමට අපේක්ෂකයනට අවකාශ ඇත.

(අ) වීරගොඩ—අම්පාරේ දිස්ත්‍රික්කය.

(ආ) ගෝනගොල්ල—අම්පාරේ දිස්ත්‍රික්කය.

(ඇ) පුල්මොඩේ—ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය.

(ඈ) මැදියාව—කුරුණෑගල දිස්ත්‍රික්කය.

2. කොළඹ-5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ද ලබා ගත හැකිය.

3. සෑම ටෙන්ඩර් කරුවෙකුම රු. 5,000 කට නොඅඩු කොන්ත්‍රාත් භාර ගැනීමට ටෙන්ඩර්කරුවන් වශයෙන් රජයේ ලියා පදිංචි විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970.5.15 දින ප. ව. 4 දක්වා ටෙන්ඩර් පත් ලබා ගත හැකිය :—

(අ) 3 ඡේදයේ සඳහන් අයුරු ලියා පදිංචි වී ඇති බව ඔප්පු කිරීම.

(ආ) එක් එක් ස්ථානය වෙනුවෙන් රු. 25 බැගින් ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ-5,
1970. 4. 11.

4–944—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### බදුල්ල දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයට ගරාජය සහ ගබඩා තැනීම

බදුල්ල දි. කෘ. ව්‍යා. කාර්යාලයට ගරාජය සහ ගබඩා තැනීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජූනි මස 1 වෙනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. කොළඹ-5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙළ කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ද ලබා ගත හැකිය.

3. ටෙන්ඩර් කරුවන් රු. 20,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලිය කියවිලි ඉදිරිපත් කිරීමෙන් 1970.5.15 දින ප. ව. 3 දක්වා ටෙන්ඩර් පත් ලබා ගත හැකිය :—

(අ) ඉහතින් 3 වෙනි ඡේදයේ සඳහන් අයුරු ලියාපදිංචි වී ඇත් බව ඔප්පු කිරීම.

(ආ) රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලට කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970.4.22 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ-5.

4–943—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පොම්ප සහ වතුර ඉසින වාරිමාර්ග උපකරණ දැනට තිබෙන තොග යෙන් සැපයීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මැයි මස 15 වැනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර, පූර්වෝක්ත 1 ඡේදයෙහි සඳහන් වන දිනයෙහි එකී වේලාවට පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

3. ටෙන්ඩර් කොළඹ 2, වොක්ෂෝල් වීදියේ අංක 315, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂගෙන් (ව්‍යාප්ති) 1970 මැයි මස 14 වැනි දින දහවල් 12 තෙක් ඉල්ලුම් කොට ලබා ගත හැකි ඉල්ලුම්පත්‍ර ෆෝර්ම්වල ලියා ඉදිරිපත් කළ යුතුය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් 2 කින් යුක්ත විය යුතුය. ටෙන්ඩර්පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ "පොම්ප සහ වතුර ඉසින වාරිමාර්ග උපකරණ සැපයීම සඳහා" ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රයයි යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියාපදිංචි තැපැල මගින් ද, ටෙන්ඩර්පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මේ අයුරින් එවීමට කැමති නොවන්නේ නම්, එවිට එම ටෙන්ඩරය මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයෙකු මගින් හෝ ටෙන්ඩර් පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දැන්වීමට බලය දී සිටින පේරාදෙනි යේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර වෙත භාරදීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන් වූ විස්තරද ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය.)

6. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබා ගැනීමට පළමුව ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් සියයක් (රු. 100) කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නමට ඕනෑම දිසාපති කාර්යාලයක තැන්පත් කර, ඒ බවට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. කොළඹ 2, වොක්ෂෝල් වීදියේ අංක 315, කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ ව්‍යාප්ති අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩි දුර විස්තර හා කොන්දේසි ද දැනගත හැකිය.

ඊ. එල්. එෆ්. අබේරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970 අප්‍රේල් මස 23 වැනි දින.

4–988—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුණ්ඩසාලේ කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ 3බී නිවාස 1ක් හා 2ඒ නිවාස 1ක් ගොඩනැගීම

ඉහත සඳහන් ගොඩනැගිලි තැනීම සඳහා පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.6.1 දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට, අලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැකිය.

3. සෑම ටෙන්ඩර්කරුවෙකුම රු. 60,000 කට නොඅඩු කොන්ත්‍රාත් භාර ගැනීමට ටෙන්ඩර්කරුවන් වශයෙන් රජයේ ලියා පදිංචි විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970.5.15 දින ප. ව. 4 දක්වා ටෙන්ඩර් පත් ලබා ගත හැකිය :—

(අ) 3 ඡේදයේ සඳහන් අයුරු ලියා පදිංචි වී ඇති බව ඔප්පු කිරීම.

(ආ) එක් එක් ස්ථානය වෙනුවෙන් රු. 100 බැගින් ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ, හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු අංශය,
පළතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ 5,
1970.4.22.

4–956—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හපුතලේ දුම්රිය පලේ සිට රහංගල බීජ අර්තාපල් ගොවිපල ගබඩා කරා බීජ අර්තාපල් ටොන් 1,500 ත් 2.000 ත් අතර ප්‍රමාණයක් ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 මැයි මස 10 වෙනි දින ප. ව. 2.30 දක්වා හපුතලේ දුම්රිය පලේ සිට රහංගල බීජ අර්තාපල් ගොවිපල ගබඩා කරා බීජ අර්තාපල් ටොන් 1,500 ත් 2,000 ත් අතර ප්‍රමාණයක් ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරී තැනගෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝරම්වල ටෙන්ඩර් මිල ගණන් සඳහන් කර ටෙන්ඩර් පත්‍රිකා අඩංගු ලිපි කවරය සීල් තබා ලිපි කවරයේ මුදුන් කෙළවරේ "හපුතලේ දුම්රිය පලේ සිට රහංගල බීජ අර්තාපල් ගොවිපල ගබඩා කරා බීජ අර්තාපල් ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර පහත වම් කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කර පහත සඳහන් ලිපින යට ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍රිකා පිටපත් දෙකකින් යුක්ත විය යුතුය :—

සභාපති,
ටෙන්ඩර් මණ්ඩලය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙනිය.

3. ටෙන්ඩර් පත්‍රිකා ටෙන්ඩර්කරුවන් කැමතිනම් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර මණ්ඩල යේ සභාපති වෙත අතින්ම ගෙන ගොස් භාර දීමට හෝ එහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට හෝ බහාලිය හැක.

4. බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරී තැනගෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීම සඳහා රු. 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මෙම මුදල් තැන්පත් කිරීම පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ ඕනෑම දිසාපති කාර්යාලයක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂක ගේ අංක 37 දරණ ගිණුමට හෝ කළ හැකිය.

5. ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් විසින් හපුතලේ දුම්රිය පලේ සිට රත්කැරව්ව හරහා රහංගල බීජ අර්තාපල් ගොවිපල ගබඩා කරා බීජ අර්තාපල් ටොන් 1 ක් හැතපුම් 1 ක් ප්‍රවාහණය කිරීමට අය කරන මුදලත්, හපුතලේ දුම්රිය පලේ සිට වැලිමඩ හරහා රහංගල ගොවිපල බීජ අර්තාපල් ගබඩා කරා බීජ අර්තාපල් ටොන් 1 ක් හැතපුම් 1 ක් ප්‍රවාහණය කිරීම සඳහා අය කරන මුදලත්, වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් ෆෝරම්වල සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර් මිල ගණන් පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතු අතර, යම් වෙනසක් කළහොත් එකී ස්ථානවල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තබා ඒ බැව් සහතික කළ යුතුය.

7. නියමිත දිනයේ එකී වේලාවට පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘ. අ. ගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් එකී වේලාවට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

8. නියමිත ෆෝරමයේ ලියා නැති හෝ නියමිත කොන්දේසි ඉටු වී නැති හෝ ටෙන්ඩරයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ.

9. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බැව් දන්වා දින 5 ක් ඇතුළත තමා ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයේ, අඩංගු මිල ගණනින් 5% ක මුදලක් ඇප වශයෙන් තබා ගිවිසුම් පත්‍රය අත්සන් කළ යුතුය. මේ සඳහා මුද්දර ගාස්තුව කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතුව ඇත.

කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් අනුව සම්පූර්ණ අර්තාපල් තොගයම ප්‍රවාහණය කිරීමට යන වියදම අනුව 5% ඇප මුදල නියම කරනු ලැබේ.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිත යාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයකුගේ නමත් සමග නම ඇතුලත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් ඇති, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුම කට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොම සාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී පොලොන්නරුව දිස්ත්‍රික් කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් **වූ අයයි.**

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුලත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරී තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 මැයි මස 25 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරී තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවනතුරු වලංගුව තැබිය යුතුය.

ආර්. පී. විමලසේන,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.
පොලොන්නරුව දිස්ත්‍රික්කය.

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1970 අප්‍රේල් මස 19 දින දිය.

4–899—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් දැන්වීම්

කිරුම්පාලම් විකට්පත්‍ර 4,00,000 ක් (පිටපත් දෙකකින් යුතුව) මුද්‍රණය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 මැයි මස 16 වෙනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයෙහි ආහාර කොමසාරිස් විසින් භාරගනු ලැබේ.

ආහාර කොමසාරිස් වෙත රු. 200ක් තැන්පත් කිරීමෙන් 1970 මැයි මස 15 දින දවල් 12 දක්වා ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් (පිටපත් දෙකකින් යුතුව) ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පිළිබඳ සියළුම කොන්දේසි සහ අවශ්‍ය විස්තර ආහාර කොමසාරිස්ගෙන් ලබා ගැනීමට පුළුවන.

ඇම්. ඞී. ඕ. පීරිස්,
ආහාර කොමසාරිස් වෙනුවට.

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
අංක 330, යූනියන් පෙදෙස,
කොළඹ-2.

4–938—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ගෙන යා හැකි ජෙනරේටර් දෙකක් සැපයීම

පහත සඳහන් සේවය සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 70. 5. 29 වැනි දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**ගෙන යා හැකි යන්ත්‍රයෙන් ක්‍රියා කරවන ජෙනරේටර් 2 යි.**

වෝල්ට් 220, සයිකල්ස් 50.

(i) වොලට් 800 ක් නිපදවීම.

(ii) වොල්ට් 1500 ක් නිපදවීම.

ටෙන්ඩර්කරුවන් විසින් සැපයීම කළ යුත්තේ තිබෙන තොගයෙන් හෝ ආනයනය කරන තොගයෙන් සපයා කිරුළපනයේ මධ්‍යම ගබඩාවට භාරදීමටත්ය. ටෙන්ඩර් කරුවන් විසින් භාර දිය හැකි ඉතාම නුදුරු කාලසීමාව සඳහන් කළ යුතුය.

2. 1970. 5. 25 වෙනි දින දාවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්ත මේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් විදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25 ක් තැන් පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. සියලු ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙලවරේ "ගෙන යාහැකි ජෙනරේටර් දෙකක් සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙලවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ග යෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනට භාර දිය යුතුයි.

4. ටෙන්ඩර් ෆෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නො හැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නො හැකිය.

6. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරි පත් කළ යුතුයි. පිළිගත් විස්තරයට යම්කිසි වෙනස් වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නම ද ඇතුලත් වන්නේ ය.

8. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව වේදී 1970.5.29 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

9. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන් ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

10. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරුතැනගෙන් විමසන්න.

පී. එස්. සුප්‍රමනියම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
1970. 4. 23,
සීවී/2/412

4–959—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට මැදිරි ආලෝක කිරීමේ බැටරි සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් (ලිපිනය: දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්‍යාලය, තැ. පෙ. 355, කොළඹ 10), 1970 ජූනි 5 වෙනි සිකුරාදා පෙ. ව. 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට සහ හරියාකාර ඉටු කිරීමට තමාගේ මුදල් තත්වය ප්‍රමාණවත් බව, අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුයි.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපත් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970. 5. 30 වෙනි සෙනසුරාදා දහවල් 12.00 වනතෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1970 ජූනි මස 5 වෙනි සිකුරාදා පෙරවරු 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

1970 අප්‍රේල් 22 වෙනි දින,
කොළඹදීය.

4–955—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### "පුහුණු මාරු 1" නැමැති පුහුණු කරවීමේ බෝට්ටුව විකිණීම

"පුහුණුමාරු 1" නමැති බෝට්ටුව විකිණීම සඳහා, ටෙන්ඩර් පත්‍ර කොළඹ 3, ගාළුමුවදොර ධීවර දෙපාර්තමේන්තුවේ ධීවර අධ්‍යක්ෂ විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ලියකියවිලි හා වැඩි විස්තර 70.5.14 වැනි දින දහවල් 12 වන තෙක් පහත අත්සන් කර ඇති අයගෙන් ලබාගත හැකිය.

ටෙන්ඩර් පත්‍ර භාරගැනීම 70.5.15 වැනි දින පෙ. ව. 10.30 ට අවසන් කරනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් මුදල රු. 200 කි.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
කොළඹ 3,
1970 අප්‍රේල් මස 22 වැනිදා.

4–932—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—කළුතර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1970 ජූනි 1 වනදා සිට 1970 දෙසැම්බර් 31 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයින්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර්පත්‍ර කළුතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, ගාල්ල, නුවර, කෑගල්ල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි වරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, කළුතර'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ ලේකම් තැනට භාරදෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10·ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොළේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමු වැනි ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. රෝගීන්ට හා සේවකයින්ට ආහාර සැපයීමට අවශ්‍ය සහල් ප්‍රමාණය එක් අයෙකුගේ සලාකයක පදනම මත කොන්ත්‍රාත්කරුවන් වෙත ඒ ඒ ආයතන භාර නිලධාරී මගින් නියෝජ්‍ය ආහාර කොමසාරිස් විසින් සතිපතා ලබා ගැනීමට අවසරපත් නිකුත් කරනු ඇත.

ඒ. ජී. එච්. තාබෲ,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී.

1970 අප්‍රේල් මස 16 වෙනි දින,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට — මාළු | සේවකයින්ට — මස් | සේවකයින්ට — කරවල | සේවකයින්ට — එළවළු | රෝගීන්ට — මාළු | රෝගීන්ට — මස් | රෝගීන්ට — කරවල | රෝගීන්ට — එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. බණ්ඩාරගම මාතෘ නිවාසය ... | 100... | 400* | 1970.5.23 පෙරවරු 10.00 ට | 150... | 139... | 146... | 642... | 63... | 61... | 65... | 272 |
| 2. බුලත්සිංහල මාතෘ නිවාසය ... | 100... | 300* | | 275... | 266... | 248... | 1,140... | 399... | 424... | 386... | 1,708 |

4–887—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1970 ජූනි 1 වන ද සිට 1970 දෙසැම්බර් 31 වන ද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පුත්තලම සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකු ශාඛාවේ හෝ තැන්පත්කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතු යි.

**සැ.යු.**—කොළඹ, යෝක් වීදියේ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝරම මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයේ දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, වවුනියාව සහ රත්නපුරය යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදි ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවැනි ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑ ම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයේ 5 තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි තැන, පුත්තලම'' කිය එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන් ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයේ බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව ප්‍රාදේශිය ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකු ගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැක.

8. **ටෙන්ඩරයෙහි තීරණ.**—ටෙන්ඩර්පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන පොරොන්දු පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නො ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන් ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුම් කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිලේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ආර්. එච්. පීරිස්,
සෞඛ්‍ය සේවා අධිකාරී, පුත්තලම.

1970 අප්‍රේල් මස 17 වෙනි දින,
පුත්තලම, සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් (පසු ගිය මාස 6 තුළ) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | | |
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ඇප මුදල රු. | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු | කිරි ආහාර |
| උඩප්පුව ග්‍රාමීය රෝහල ... | 100... | 600 | 15.5.70 පෙ.ව. 10 ට | 300... | — ... | 200... | 600... | 400... | — ... | 200... | 800... | — |

4–888—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### වැඩට ගත නොහැකි මෝටර් වාහන විකිණීම

මෙහි පහත දැක්වෙන මෝටර් වාහන විකිණීම පිණිස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් 1970 මැයි මස 23 වන ද පෙරවරු 9.30 දක්වා, සීල් තබන ලද ටැන්ඩර් බාර ගනු ඇත.

| ලියා පදිංචි අංකය | වර්ගය | සඳහන් කළ යුතු අඩුම මිළ |
|---|---|---|
| රී. එන්. 2328 ... | රෝද 4න් දුවවන විලිස් කොළ පාට විවෘත ජීප් රිය ... | රුපියල් 4,500 |
| සී.එන්. 1156 ... | ඔස්ටින් ගිලන් රිය ... | 3,000 |

කොළඹ 5, නාරාහේන්පිට, මැලේරියා නාශක ව්‍යාපාරයේ අධිකාරී සමඟ කලින් දිනයක් පිළියෙල කර ගැනීමෙන්, මේ වාහන කාර්යාල වේලාව තුළ පිරික්සා බැලිය හැකි වේ.

2. ටැන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ (කොළඹ කච්චේරිය හැර) වෙනත් කච්ඡේරියක හෝ, කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ හෝ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමට රු. 100 ක ටැන්ඩර් මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1970 මැයි මස 14 වන ද පස්වරු 4 දක්වා (සෙලින්කෝ මන්දිරයේ පිහිටි) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ගේ ගිණුම් අංශයෙන් ලබා ගත හැකි ආකෘතිපත්‍ර මත පිටපත් දෙකකිනි. එක් එක් වාහනය අරබයා වෙන වෙනම මිළ ගණන් දැක්විය යුතුයි.

3. ටැන්ඩර් බහා එවන හැම කවරයක ම වම් පැත්තේ උඩු කෙළවරේ ''වැඩට ගත නොහැකි වාහන මිලේට ගැනීම සඳහා ටැන්ඩර් '' යනුවෙන් හනක් තබා, එය කොළඹ, සෙලින්කෝ මන්දිරයේ තැ. පෙ. අංක 584 හිමි (ගිණුම්) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂට පිට නම ලියා එවිය යුතුයි. ටැන්ඩර් කරුගේ සම සහ ලිපිනය ද කවරයේ වම් පැත්තේ යට කොටසේ දැක්විය යුතුයි. ටැන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් හෝ එවිය යුතුයි. නැත්නම් කොළඹ, සෙලින්කෝ මන්දිරයේ 5 වන මහලේ ඒ සඳහා තබා ඇති ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුයි.

4. මෙහි 1 වන ඡෙදයේ සඳහන් දිනයේ එකී වෙලාවෙන් ඉක්බිති ටැන් ඩර් විවෘත කරනු ලැබේ. ටැන්ඩර් කවර කඩා බලන විට ටැන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැකි වේ. ටැන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුනොවුන් විසින් සඳහන් කරන්නට යෙදුණු මිළ ගණන් ඒ වේලාවේදී කියවනු ඇත.

5. ටැන්ඩරය බාර ගත් බව දනුම් දී 3 දිනක් ඇතුළත එහි මුළු වටිනාකම ගෙවා වාහනය ගෙන යාමට ජයගත් ටැන්ඩර්කරු අපොහොසත් වෙතොත්, කිසිදු අයිතිවාසිකමකට ඉඩ නොතබා තැන්පත් මුදල රාජ සන්තක කරනු ඇත.

6. තමන්ගේ ටැන්ඩරය පිළිගත් බවට ලියා දෙන දැන්වීමක් ලැබී හත් දිනක් ඇතුළත, තමන් ටැන්ඩර් කළ මිළ මුළුමණින් ගෙවා දැමීමට යම් ටැන්ඩර්කරුවෙකු නොකැමති වෙතොත් හෝ, අපොහොසත් වෙතොත් හෝ ඔහු තැන්පත් කළ මුදල රාජ සන්තක කොට, ඊ ළඟට ඇති ඉහළ මිල ගණන සඳහන් කළ ටැන්ඩර්කරුට වාහනය දෙන අතර, රජයේ කටයුතු පැහැර හරින ටැන්ඩර්කරුවන්ගේ නම් ලැයිස්තුවට මුලින් කී අයගේ නම ඇතුළත් කිරීමටද ඉඩ තිබේ.

7. 1970.5.14 වන ද පස්වරු 4 තෙක් ටැන්ඩර් කොළ නිකුත් කරනු ඇත.

8. 1970 මැයි 23 වන ද පෙරවරු 10 ට කොළඹ සෙලින්කෝ මන්දිර යේ පිහිටි (ගිණුම්) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ කාමරයේදී ටැන්ඩර් විවෘත කරනු ඇත. ටැන්ඩර් විවෘත කරන විට ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරම් ලත් නියෝජිතයින්ට හෝ කැමැති නම් එහි පෙනී සිටීමට අවසර ඇත.

9. තමන් ඉදිරිපත් කරන ටැන්ඩර් මිළ ගණන ටැන්ඩර් පිය වූ දිනයේ සිට සති 4 ක කාලයකට වලංගු වන සේ තබා ගනු ඇතැයි ටැන්ඩර්කරුවන් ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

10. ටැන්ඩර් කරන ගණන ඉලක්කමෙනුත් නැවත අකුරෙනුත් ටැන්ඩර් කොලයේ ලියා තිබිය යුතුයි. වචන සහ/නොහොත් ඉලක්කම් අතරේ යම් පරස්පරයක් දක්නට ලැබුණොත් ටැන්ඩරය පිටු දකිනු ලැබීමට යටත් වේ. ටැන්ඩර් පතේ කරනු ලබන වෙනස් කිරීම් සහ මකා හැරීම් සියල්ලට ටැන් ඩර්කරුගේ කෙටිහන යෙදිය යුතුයි.

11. මෙහි 5 වන ඡෙදයේ කොන්දේසියට යටත්ව ටැන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ඇත.

12. මේ පිළිබඳ වැඩි දුරටත් විස්තර වුවමනා වෙතොත්, කොළඹ මහ ලේකම් පාරයේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරියාගෙන් විමසා දැන ගත හැකි වේ.

13. ටැන්ඩර් පත් සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ පිළි ගැනීමට නැත් නම් පිටු දැකීමට ඇති අයිතිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සතු වේ.

කේ. දෙරේරාජා,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1970 අප්‍රේල් මස 23 වන ද, කොළඹ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේදීය.

4–937—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 මැයි මස 23 වැනි සෙනසුරාදා පෙ. ව. 10 වනතෙක් මෙහි පහත සඳහන් වන වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| 1. හලා/පිලාකටුමුල්ල | ... | වහල අළුත්වැඩියාව |
| 2. හලා/නාත්තන්ඩිය ම. වි. | ... | ක්‍රීඩාපිටිය වැඩිදියුණු කිරීම |
| 3. හලා/බමුණුගම වි. | ... | පාසැල් ගොඩනැගිල්ල |
| 4. හලා/නාත්තන්ඩිය ම. වි. | ... | ගොඩනැගිලි අලුත්වැඩියාව, වැසිකිලිය හා කැසිකිලි දෙකක් තැනීම. |

සංලක්ෂය :—හලා/හලාවත දිස්ත්‍රික්කය

2. හලාවතින් බැහැර ඕනෑම කච්චේරියක හෝ හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 හා 2 වැඩවලට රු. 5,000 හා ඊට වැඩි ගණනකට, අංක 3 වැඩවලට රු. 15,000 හා ඊට වැඩි ගණනකට, අංක 4 වැඩවලට රු. 17,500 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට 1970 මැයි මස 22 වැනි සිකුරාදා ප. ව. 3 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000කට අඩුවැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්) චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මංඩලයේ සභාපතිවෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් අධ්‍යාපන කාර්යාලයේ පාලන නිලධාරි/ප්‍රධාන ලිපිකරු වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 මැයි මස 23 වැනි සෙනසුරාදා පෙ. ව. 10.30ට හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කල දින සිට සති හයක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එල්. බී. හේරත්,
හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970.4.20 වැනි දින,
හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේදී ය.

4—942—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 මැයි මස 16 වෙනි දින ප. ව. 2.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර පොළොන්නරුව, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

| පාසැලේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. පො/විජිත මහා විද්‍යාලය | ...ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සහ අළුත්වැඩියා කිරීම. |
| 2. පො/අල් හිලාල් මුස්ලිම් වි. | ...ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සහ අළුත්වැඩියා කිරීම. |
| 3. පො/කිරිමැටිදමන වි. | ...ළිඳ ඉදිකිරීම |
| 4. පො/විජයබාහුපුර වි. | ... ගොඩනැගිලි, ළිඳ සහ ගේට්ටුව අළුත්වැඩියා කිරීම. |

සංලක්ෂ්‍යය—පො/(පොළොන්නරුව දිස්ත්‍රික්කය)

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේ හෝ එක් වැඩ සඳහා රු. 100 බැගින් මුදල් තැන්පත් කර එම කුවිතාන්සිය පොළොන්නරුව අධ්‍යාපන නිලධාරි වෙත ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් මුදල්වලට හෝ ඊට වැඩි මුදලකට හෝ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 මැයි මස 15 දින පෙරවරු 12 දක්වා ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000ට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේවීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

අවශ්‍ය ලියාපදිංචිය :—අංක 1 සහ 2 සඳහා රු. 10,000 සහ 3 සහ 4 සඳහා රු. 5,000

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන්, දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර දෙවැනි හා තුන්වැනි ඡේදවල සඳහන් පරිදි පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද ලබාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපැලෙන්,

ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර්පත්‍ර කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලි ලෙස ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පෞද්ගලිකව පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු වෙත භාරදිය යුතුයි.

5. 1970 මැයි මස 16 දින ප. ව. 2.30ට පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කළ මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමැති විය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තරයක් වෙතොත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තැනගේ කාර්යාලයෙන් දැනගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1966.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

කා. සො. පලිහක්කාර,
ප්‍රධාන අධ්‍යාපන නිලධාරි,
පොළොන්නරුව.

1970 අප්‍රේල් මස 19 දින,
පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේදී ය.

4–896—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 මැයි මස 23 වැනි දින පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

| ආයතනයේ නම | වැඩෙහි ස්වභාවය |
|---|---|
| වරකාපොල කණිෂ්ඨ කාර්මික ... ආයතනය | නිවස තැනීම. |

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ හෝ කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයේ හෝ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 1,25,000කට හෝ ඊට වැඩි මුදලකට ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 මැයි මස 19 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් හෝ ලබා ගත යුතුය. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර්පත්‍ර මේ වැඩය සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි සහ 3 වැනි ඡේදවල සඳහන් පරිදි ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. මොහුගෙන් වැඩය සම්බන්ධව සියලු විස්තර දැනගත හැකි අතර, සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නො එවන ටෙන්ඩර්පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පෞද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාර දිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩර් භාර ගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

5. 1970 මැයි මස 23 වැනි දින පෙරවරු 10.30ට අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරණ වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් භාර ගැනීම අවසන් කළ දින සිට සති 6ක් ගතවන තුරු තමන් සඳහන් කරන මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් නිකුත් කිරීමේ දී 1966. 9. 30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් කරණ ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් කරණ ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඔලිවර් අබේසේකර,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
කෑගල්ල.

1970 අප්‍රේල් මස 19 වැනි දින,
කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දීය.

4–878—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## මොණරාගල කච්චේරිය

### 1970 කතරගම ඇසළ උත්සවය

1970 කතරගම ඇසළ උත්සවය නිමිත්තෙන් කතරගම ඉදිකෙරෙන තාවකාලික ගොඩනැගිලි හා වැසිකිළි සඳහා 1970 මැයි මස 22 වැනි දින පස්වරු 2 දක්වා මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති විසින් පහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

(1) අක්කර 38ක ප්‍රදේශයේ ළඳු කැළය ශුද්ධ කිරීම.

(2) බටහිර දිසාවේ තාවකාලික ගොඩනැගිලි තැනීම.

(3) නැගෙනහිර දිසාවේ තාවකාලික ගොඩනැගිලි තැනීම.

(4) තාවකාලික වැසිකිළි 960 ක් තැනීම.

2. රු. 20,000 වැඩි රජයේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට 1970 මැයි මස 12 වැනි දින පස්වරු 2 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ඊට ප්‍රථම ඉහත සඳහන් එක් එක් වැඩ කොටස සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් බැගින් වෙන් වෙන් වශයෙන් දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය.

3. මොණරාගල දිස්ත්‍රික්කයේ රජයේ දිසාපතිගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘතිවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් විවෘත කිරීම 1970 මැයි මස 22 වැනි දින පස්වරු 2.05 ට මොණරාගල කච්චේරියේ දී කරනු ලැබේ. මේ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

5. එක් එක් වැඩ කොටස සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් එවිය යුතුය. ඉල්ලුම් කරන වැඩ කොටසේ නම ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ සඳහන් කොට සීල් තබා ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ මෙම කච්චේරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලීමට හෝ පුළුවන.

6. තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරු වහාම වැඩ පටන් ගැනීමට සූදානම්ව සිටිය යුතුය.

7. වැඩි විස්තර කාර්යාලීය වේලාවන් හිදී මොණරාගල දිසාපතිගෙන් ලබා ගත හැක.

8. යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයකින් කොටසක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මොණරාගල දිසාපති වෙත ඇති බව සැලකිය යුතුය.

මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 අප්‍රේල් මස 19 දින,
මොණරාගල,
දිසාපති කාර්යාලයේ දීය.

4–889—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

## කළුතර කච්චේරිය

### කළුතර දිස්ත්‍රික්කයේ පාරවල් තැනීම

පහත සඳහන් වැඩ සඳහා රුපියල් විසි දාහකට (රු. 20,000) හෝ ඊට වැඩි තැනීම් වැඩ වෙනුවෙන් රජයේ වැඩ, අධ්‍යාපන හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් සහ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති (රු. 20,000) සහ ඊට වැඩි වටිනාකම් ඇති වැඩ සඳහා ඉහත සඳහන් දෙපාර්තමේන්තුවක ලියාපදිංචිව ඇති සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

(1) පාලයන්ගොඩ ව්‍යාපාරයට පිවිසෙන පාර තැනීම.
(2) කුඩලිගම ඉද්දගොඩ පාරේ බෝක්කු තැනීම.

2. ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුතුව පිළියෙල කොට, සීල් තබා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ නමට එවිය යුතුය.

3. ටෙන්ඩර්, ගාලු මුවදොර මහලේකම් කාර්යාලයේ 3 වැනි තට්ටුවේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුය. නොඑසේ නම්, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙළවරේ වැඩයේ නම ලියා 1970.5.29 වැනිදා පස්වරු 2.30 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුය. එදින එම වේලාවේදීම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවා ඇත. ටෙන්ඩර් කරුවන්ටද එම වේලාවේ දී පැමිණ සිටිය හැක.

5. 1970.5.24 වැනි දින දවල් 12 දක්වා කළුතර දිසාපති කාර්යාල යේ දී ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැකිය. නියමිත ෆෝර්මයේ ඉදිරිපත් නොකරන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරු විසින් එවනු ලබන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලබන මැකීම්, කටුගෑම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයක්ම ඔහුගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුය.

7. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර, රු. 20 ක් කළුතර දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස්ය.

8. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාර ගත් බවට ලිපියකින් දන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින දහයක් ඇතුලත අපොහොසත් වුවහොත්, ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

9. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දන්වීම් ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත්, හෝ ඒ දැන්වීම ටෙන්ඩර්කරුට ලැබුනාක් මෙන් සළකනු ලැබේ. ගිවිසුම් පත් අත්සන් කිරීමෙන් පසුව අනික් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

10. තෝරා ගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුළ නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස කළුතර දිසාපති විසින් ඔහුට දැනුම් දෙනු ඇත. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස්ය.

11. ටෙන්ඩර් වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීමේ හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීමේ අයිතිය මුළුමණින්ම රජය කෙරෙහි පවත්නේය.

12. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ එහි කොටසක් වෙන කෙනෙකුට කුලියට දීම හෝ නොකළ යුතුය. කොන්ත්‍රාත්කරු වෙනුවට වැඩ කරගෙන යාමට වෙන කෙනෙකුට බලය දෙමින් කොන්ත්‍රාත්කරු විසින් දෙන ලද ඇටෝර්නි බලයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිවාසිකම් රජය කෙරෙහි පවත්නේය.

13. කොන්ත්‍රාත්කරු යටතේ සේවය කරන යම්කිසිවකුගේ සේවය සම්බන්ධයෙන් ප්‍රමාණවත් යැයි හැඟී යන කරුණු උඩ කළුතර දිසාපති විසින් ලියවිල්ලකින් විරුද්ධත්වය දැක්වූ විට, කොන්ත්‍රාත් කරු විසින් එවැනි අයගේ සේවය නතර කළ යුතුය.

14. කොන්ත්‍රාත්කරු සහ ලංකාණ්ඩුව වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තැනද මෙම කොන්ත්‍රාත්තුවට අත්සන් කළ යුතුය. ලංකාණ්ඩුව වෙනුවෙන් කොන්ත්‍රාත්තුවට අත්සන් කරන අයගේ නිල තත්ත්වයට අනුව එවකට සහ ඉන්පසු මෙම නිලයෙහි අත්සන් කරන ලද අයද අයත් වේ.

15. මෙයට පෙර භාර ගන්නා ලද කොන්ත්‍රාත් වැඩ කරගෙන යන අපේක්ෂකයින් කල්වේලා ඇතිව ඔවුන් දැනට කරගෙන යන වැඩ වල තත්ත්වය දැක්වෙන එම වැඩ භාරව සිටින පරිපාලක නිලධාරින් ගෙන් ලබා ගන්නා ලද සහතික පත්‍ර ටෙන්ඩර් ඇප මුදල තැන්පත් කොට ලබා ගන්නා ලද ලදුපත් සමග කළුතර දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

16. යම් ටෙන්ඩර් පත්‍රයක් පිළිගැනීමේ දී ඇපකරුවන් අවශ්‍ය වුවහොත් තෝරා ගත් ටෙන්ඩර්කරු මෙම අවශ්‍යතාවය සපුරාලීමට සමත් විය යුතුය.

17. රජයේ වෙනත් දෙපාර්තමේන්තුවලට අයත් කොන්ත්‍රාත් වැඩ කර තිබෙන කොන්ත්‍රාත්කරුවෙක් වෙතොත් සේවය කොට ඇති දෙපාර්තමේන්තුවේ නම සහ දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය.

18. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයේ නම් ඇතුලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1970.4.17 දින,
කළුතර දිසාපති කාර්යාලයේ දීය.

4–857—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

වැවේගම මාතෘ නිවාසයේ ඇඳන් 12ක වාට්ටුවක් තැනීම සඳහා වූ ටෙන්ඩර් පත් නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 මැයි මස 22 වැනි සිකුරාදා පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

2. බදුල්ල ගොඩනැගිලි දෙපාතීමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙළ කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිවන අතර, සැලැස්වල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාතීමේන්තුවේ, ගොඩනැගිලි දෙපාතීමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 66,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 මැයි මස 8 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රුපියල් 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ජී. ඩී. සමරසූරිය,
නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු,
ගොඩනැගිලි

අධිකාරි ඉංජිනේරු කාර්යාලය,
නැගෙනහිර කොට්ඨාශය,
ගොඩනැගිලි දෙපාතීමේන්තුව,
බදුල්ල.

4–854—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 1.) 1970.7.1 සිට 1971 6. 30 තෙක් මෝටර් රථ වාහන ආදියට මෙරට සැදූ බැටරි සැපයීම සඳහා 1970 ජූනි මස 2 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 ජූනි මස 1 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹදීය.

4–925—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙන්දේසි කිරීම්

වවුනියා අඩවියේ ඇති ඝන අඩි 52.3 යුත් 1 වැනි පංතියේ ඉරූ දැව කෑලි 53 ද, ඝන අඩි 634.3 යුත් 1 වැනි පංතියේ කඳන් 76 ද, 1 වැනි පංතියේ තේක්ක කනුවක් ද, වවුනියා දිසා වන නිලධාරී විසින් 1970. 5. 7 දින පෙ. ව. 10 ට වවුනියා අඩවි වන කාර්යාලයේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දැව වෙන්දේසියේ විකිණීමට ප්‍රථම පරීක්ෂාකර බලන ලෙස වෙන්දේසියෙන් දැව ගැනීමට අපේක්ෂා කරන සියලු දෙනාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩි විස්තර මෙහි පහත අත්සන් කර ඇති අයගෙන් හෝ වවුනියා අඩවි වන නිලධාරිගෙන් ලබා ගත හැකිය.

ඇම්. රත්වත්ත,
දිසා වන නිලධාරි—වවුනියාව.

දිසා වන කාර්යාලය,
වවුනියාව.
1970. 4. 4

4–882—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

### වෙන්දේසියේ විකිණීමයි

පරණ ප්‍රවෘත්ති පත්තර රාත්තල් 300 ක් පමණ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ න්‍යාය පුස්තක කාර්ය සටහන්, පාර්ලිමේන්තු විවාද පොත්, ටැලිපෝන් නාමාවලී, පාලන වාර්තා, මුද්‍රිත ඇස්තමේන්තු යනාදිය රාත්තල් 400 ක් පමණද, 1970 මැයි මස 7 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10 ට කොළඹ 7, බාන්ස් පෙදෙසේ අංක 14, සමාජ සේවා අමාත්‍යාංශයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය අවසන්වූ වහාම පරණ ප්‍රවෘත්ති පත්තර සහ ප්‍රකාශන මුදල් ගෙවා ගෙන යා යුතුය.

වී. බ. මැවේගම,
සමාජ සේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්
වෙනුවට.

සමාජ සේවා අමාත්‍යාංශය,
14, බාන්ස් පෙදෙස,
1970. 4. 19 දින.

4–871—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

මෙම උසාවියේ ඇති පහත සඳහන් භාණ්ඩ 1970.5.19 වන දින ප.ව. 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

(i) උසාවියේ නියෝගය පරිදි විකිණීමට නියම කර ඇති භාණ්ඩ.

(ii) පොලීසි මගින් ඉදිරිපත් කර ඇති අයිතිකරුවන් විසින් හිමිකම් ඉදිරිපත් කර නොමැති භාණ්ඩ.

(iii) උසාවිය විසින් විනාශ කිරීමට අනකර ඇති නමුත් ප්‍රයෝජනයට ගතහැකි භාණ්ඩ.

මෙසේ විකිණීමට නියමිත භාණ්ඩ—පාපැදි, අත් ඔරලෝසු, රෙදිපිළි, ගුවන්විදුලි යන්ත්‍ර, අත් බාල්දි, මන්නා පිහි, කැති ආදියෙන් සමන්විතය.

මෙම භාණ්ඩ විකිණීමට ප්‍රථමයෙන් යම් අයෙක් එකී භාණ්ඩයන් සඳහා හිමිකම් කීමට කැමති නම් වෙන්දේසි දිනට සතියකට ප්‍රථම අයිතිය පැහැදිලි කරන ලියවිලි සමග තම ඉල්ලීම් කළ යුතුය.

භාණ්ඩ මිලට ගන්නන් අත්පිට මුදල් ගෙවා වෙන්දේසි දිනදීම මිලට ගත් භාණ්ඩ ඉවත් කර ගත යුතු ය.

චෙක්පත් මගින් කරන ගෙවීම් භාරගනු නොලැබේ.

සියළුම ගෙවීම් මුදලින් කළ යුතු ය.

සී. ඊ. මෙන්ඩිස්,
මහේස්ත්‍රාත්, දකුණු කොළඹ.

මහේස්ත්‍රාත් උසාවිය,
දකුණු කොළඹ,
ගල්කිස්ස.
අප්‍රේල් 23, 1970.

4–953—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

---

### ප්‍රසිද්ධ වෙන්දේසිය

1970 මැයි මස 17 වෙනි ඉරිදා පූර්ව භාග 10 ට කොළඹ 3, බාලදක්ෂ මාවත (පහළ වැව පාර) සමාජ සේවා දෙපාර්තමේන්තු භූමි භාගයේ පිහිටි ''සෙත්සලේදී'' (පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ සිට යාර 150) මෙම දෙපාර්තුව මගින් පුහුණු කරන ලද අඳ බිහිරි වැඩ කරුවන් විසින් නිෂ්පාදනය කරන ලද පහත සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම භාණ්ඩ ඉතා අනර්ඝ තත්ත්වයේ හා මනා නිර්මානයෙන් පවතී. සාමාන්‍ය රාජකාරි වේලාවන්හි, ඉහත සඳහන් ලිපිනයේදී මේ භාණ්ඩවලට අදල සාම්පල් පරීක්ෂා කර බැලිය හැක.

පහත සඳහන් භාණ්ඩවල ඇති තොගයන් මෙසේය :—

| | | |
|---|---|---|
| 1. | තනි කෝම්බ් තුවා සුදු 24″ × 45″ ... ... | 14,349 |
| 2. | 1½″ සනකම පාට වාටියක් ඇති ඉඳුල්කඩ සුදු 18″ × 18″ ... | 62,122 |
| 3. | කොටු දූලිකඩ ග්‍රෙ 24″ × 24″ ... ... | 1,54,584 |
| 4. | මුළුතැන්ගෙයි තුවා කොටු ග්‍රෙ 24″ × 24″ ... | 16,887 |
| 5. | අඟලක් ඝනකම පාට වාටියක් සහිත 24″ × 32″ පිහන් පිස්නා ග්‍රේ ... ... ... | 6,764 |
| 6. | තෙත මාත්තු කඩ ගෙතු 15″ × 15″ ... | 18,230 |

ගැනුම් කරුවා තමා ඉල්ලා ලබාගත් භාණ්ඩ සඳහා එක්වර මුදල් ගෙවිය යුතු අතර ඒවා වෙන්දේසිය අවසානයේදී රැගෙන යා යුතුය.

අ. ම. මු. සහබ්දීන්,
සමාජ සේවා අධ්‍යක්ෂ.

සමාජ සේවා දෙපාර්තමේන්තුව,
කොළඹ.

4–957—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම—1970.7.1 සිට 1971.6.30

සියළුම සුරාබදු බලපත්‍ර වෙනුවෙන් දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි හා 1970–71 රා රේන්ද විකිණීමේ කොන්දේසි හා 1970 මාර්තු 20 දින අංක 14,898 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඊට අනතුරු කාලසීමාවන්ට යටත්ව 1970 ජුලි 1 වැනි දින සිට 1971 ජුනි 30 වැනි දින දක්වා කාලය සඳහා පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ තනි අයිතිය මිලදීගැනීම සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම පහත සඳහන් උපලේඛනයේ නියම කර ඇති මුදලක් ගෙවීමෙන් පසු ඕනෑම කච්චේරියකින් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයක පිළියෙල කළ යුතුය. සෑම ටෙන්ඩරයක්ම එසේ ගෙවීම් කරනු ලැබීමෙන් ලබාගත් කච්චේරි කුවිතාන්සියක් සහ ටෙන්ඩර්කරුගේ දේපොල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකද අමුණා එවිය යුතුය. පසුගිය වර්ෂවල ටෙන්ඩර් සඳහා ඉදිරිපත් කරන ලද වත්කම් සහතිකයම ඉදිරිපත් කෙරේ නම්, එකිනෙක තැබෑරුම සඳහා ටෙන්ඩර් කරන ලද මුළු මුදලින් සියයට 25 ට අඩු නොවන වත්කම් සහතිකය සමහ බැඳීම් සහතිකයක්ද ඇමිණිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ ත්‍රිකුණාමලයේ දිසාපති වෙතය. සෑම ටෙන්ඩරයක්ම සීල් තබන ලද කවරයක බහා, එහි වම්පස උඩ කෙළවරේ " අංක .............. දරණ රා තැබෑරුම් සඳහා ටෙන්ඩරය " යනුවෙන් සඳහන් කළ යුතුය. සීල් තබන ලද ටෙන්ඩර් සහිත කවරය (අ) කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමෙන් හෝ මෙහි පහත දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවට පෙර දිසාපතිතුමා වෙත ලැබීමට සැලැස්විය යුතුයි.

4. 1970 මැයි මස 19 වෙනි දින ටෙන්ඩර් පත් වසනු ලැබේ.

5. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් පැමිණ සිටිය යුතුය. සාර්ථක ලෙස ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු විකිණීමේ අයිතිය ඔහු සතු බව ප්‍රකාශයට පත් කළ වහාම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා විකිණීමේ කොන්දේසි නිසි ලෙස ඉටු කිරීමේ ඇප තැන්පත් මුදල වශයෙන් දෙමසක රේන්ද කුලියට වැඩි මුදලක් ත්‍රිකුණාමලය දිසාපති වෙත ගෙවිය යුතුය.

6. යම් ටෙන්ඩර්කරුවෙක් ම ඔහුට වරප්‍රසාදය හිමි වූ බවට ප්‍රකාශ කරනු ලැබුවායින් පසුව විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට හෝ තැන්පත් මුදල් ගෙවීමට ප්‍රතික්ෂේප කළොත් එය ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල ඔහුට අහිමි වනවාත් හැර සියළුම සුරාබදු බලපත්‍ර වෙනුවෙන් කොන්දේසි කඩ කරන ටෙන්ඩර්කරුවන්ගේ නාම ලැයිස්තුවට ඔහුගේ නම ඇතුළත් කිරීමට හේතු වනවා ඇත. සාර්ථක ටෙන්ඩර්කරු විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව මේ විශේෂත්වයට යටත්ව, සෙසු ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

7. වැඩි විස්තර ත්‍රිකුණාමලය කච්චේරියෙන් ලබා ගත හැක.

8. මීළඟ රේන්ද කාලය තුළදී දැනට තැබෑරුම් පවතින ස්ථානම තැබෑරුම් පාවිච්චිය සඳහා ප්‍රයෝජනයට ගත හැකි වේ යයි සහතික කළ නොහැක

9. 1970–71 වර්ෂය සඳහා අනුමත අරක්කු තැබෑරුම් ලැයිස්තුව සහ ඉහත සඳහන් කළ උපලේඛනය ද පහත සඳහන් අයුරු වේ.

| තැබෑරුම් අංකය | කොට්ඨාශය | ප්‍රාදේශීය පළාත | විවෘත කරන වේලාව | වසන වේලාව |
|---|---|---|---|---|
| 1 | ... කොට්ඨාශ අංක 2, ත්‍රිකුණාමලය පළාත් ආණ්ඩු සභාව | ... විල්ලුන්ඩි | ... පෙ. ව. 8.00 | ... ප. ව. 8.00 |
| 2 | ... කොට්ඨාශ අංක 8, ත්‍රිකුණාමලය පළාත් ආණ්ඩු සභාව | ... උප්පුවෙලි | ... පෙ. ව. 8.00 | ... ප. ව. 8.00 |
| 3 | ... තෙකිලිකු, තම්පලාකාමම් පත්තු ... ... | ... තෙකිලිකු | ... පෙ. ව. 8.00 | ... ප. ව. 6.30 |
| 4 | ... කඩ්ඩුකුලම් පත්තු ... ... | ... නිලාවෙලි | ... පෙ. ව. 8.00 | ... ප. ව. 6.30 |

### ටෙන්ඩර් තැන්පත් මුදල සහ ටෙන්ඩර් වසන වේලාව

| තැබෑරුම් අංකය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් වසන වේලාව |
|---|---|---|
| 1 ... | 3,000 | ... පෙ. ව. 10.00 |
| 2 ... | 3,000 | ... පෙ. ව. 10.30 |
| 3 ... | 1,500 | ... පෙ. ව. 11.00 |
| 4 ... | 1,500 | ... පෙ. ව. 11.30 |

සෝමපාල ගුණධීර,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 අප්‍රේල් මස 18 දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේ දී ය.

4–885—70.4.30 දින අංක 14,904 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවකින් දී තැපැල් කිරීමෙන් ලබමිනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| මාර්තු | 70. 3. 5 බ්‍රහස්පතින්ද | 70. 2.27 සිකුරාද | දහවල් 12.0 |
| | 70. 3.13 සිකුරාද | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 70. 3.20 සිකුරාද | 70. 3.13 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| අප්‍රේල් | 70. 4. 3 සිකුරාද | 70. 3.25 බදාද | ප.ව. 3.30 |
| | 70. 4.10 සිකුරාද | 70. 4. 3 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 4.17 සිකුරාද | 70. 4. 8 බදාද | ප.ව. 3.30 |
| | 70. 4.24 සිකුරාද | 70. 4.17 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| මැයි | 70. 5. 8 සිකුරාද | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 70. 5.15 සිකුරාද | 70. 5. 8 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 5.22 සිකුරාද | 70. 5.15 සිකුරාද | ප.ව. 3 30 |
| | 70. 5.29 සිකුරාද | 70. 5.22 සිකුරාද | ප.ව 3.30 |
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් 12 0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් 12.0 |

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.